තුති වදන

ශ්‍රී ලංකා ටෙලිකොම් බෞද්ධ සංගමය විසින් වසරක් පාසා නොමිලයේ බෙදදීම පිණිස මුද්‍රණය කරනු ලබන බෞද්ධ ග්‍රන්ථ මාලාවේ දහවන ග්‍රන්ථය ශ්‍රී බුද්ධ වර්ෂ දෙදහස් පන්සිය පනස් හතර වෙනි තෙමගුල වෙනුවෙන් ධර්මදානයක් වශයෙන් ඔබ අතට පත්කරනුයේ ඉමහත් සතුටිනි.

පූජ්‍යපාද කුකුල්පනේ සුදස්සි හිමියන් විසින් සම්පාදනය කරන ලද නොනිමි මරණයේ නොමියෙන අරුත් නැමැති ධර්ම ග්‍රන්ථය තුළින් මරණය ගැන කල්පනා කරන්නට මරණය ගැන හිතන්නට, ඒ පිළිබඳව කථාකරන්නටවත් අපි කවුරුවත් කැමති නැහැ. ඒක අශුභවාදීවය අපි දකින්නේ. නමුත් අපි හැමදෙනාටම අනන්ත සසරේ හැම භවයකදීම නොවරදීම අත්විඳින්නට ලැබෙන්නෙත් මෙයමයි. නමුත් අපි අකමැති වෙනදේත් එයමයි. මරණානුස්සතිය වඩන්නාට මෙම ධර්ම ග්‍රන්ථය නිතර ලග තබා ගතයුතු අත්පොතකි. මෙම ග්‍රන්ථය ධර්ම දානයක් වශයෙන් නොමිලයේ බෙදදීම සඳහා අවසර දුන් කතු හිමියන්ට අතිශයින් කෘතඥවෙමින් අනේකවාරයක් පින්දෙමු.

මෙම ධර්මග්‍රන්ථය මුද්‍රණය කිරීමට නොපැකිලිව භාරගත් සිකුරු පොත් ප්‍රකාශකයෝ ආයතනයේ අධිපතිතුමා ඇතුළු කාර්යමණ්ඩලයට ස්තුති පූර්වකව පින්දෙමු.

මෙයට,
මෙත් සිතින්

ලලිත් කන්නන්ගර	**එම්.පද්මපෙරුම**
ගරු ප්‍රධාන ලේකම්	ගරු ප්‍රධාන සභාපති

ශ්‍රී ලංකා ටෙලිකොම් බෞද්ධ සංගමය
ශ්‍රී ලංකා ටෙලිකොම් මූලස්ථානය
කොළඹ 01. දුරකථනය: **0112350404**
බුෑව: 2554 ක් වූ වෙසක් මස

ශ්‍රී ලංකා ටෙලිකොම් බෞද්ධ සංගමය විසින් මුද්‍රණය කර නොමිලයේ බෙදාදුන් ධර්ම ග්‍රන්ථයන්

2001	- වෙසක් කලාපය	- ලොව්තුරු සුවඳ පූජ්‍ය පාද ගංගොඩවිල සෝම හිමි
2002	- වෙසක් කලාපය	- සසර සැමට හිමි කර්ම විපාක පූජ්‍ය දිවියගහ යසස්සී හිමි
2003	- වෙසක් කලාපය	- ධනය වැය නොවන මහා දාන පහක් පූජ්‍ය දිවියගහ යසස්සී හිමි
2004	- වෙසක් කලාපය	- ප්‍රශ්ණ හා වගකීම් පූජ්‍යපාද ශ්‍රී කිරින්දේ ධම්මානන්ද හිමි
2005	- වෙසක් කලාපය	- පටිච්ච සමුප්පාද ධර්මය පූජ්‍යපාද හාරිස්පත්තුවේ ආරියවංශාලංකාර හිමි
2006	- වෙසක් කලාපය	- දුක් කරදරවලින් මිදෙන්නේ කෙසේද? ශ්‍රී කිරින්දේ ධම්මානන්ද හිමි
2007	- වෙසක් කලාපය	- සිතුවිලි පූජ්‍යපාද තලල්ලේ චන්දකිත්ති හිමි
2008	- වෙසක් කලාපය	- බණක් අසන කල සිතක් තිබෙන බව හිඟුරේ පඤ්ඤාසේකර හිමි
2009	- වෙසක් කලාපය	- සිතේ සැබෑව පූජ්‍යපාද කුකුල්පනේ සුදස්සි හිමි
2010	- වෙසක් කලාපය	- නොනිමි මරණයේ නොමියෙන අරුත් පූජ්‍යපාද කුකුල්පනේ සුදස්සී හිමි

නොනිමෙන මරණයේ නොමියෙන අරුත්

(ධර්ම දේශනාවක් ඇසුරිණි.)

පොකුණුවිට, ශ්‍රී විනයාලංකාරාරාම වාසී,
පූජ්‍ය කුකුල්පනේ සුදස්සී ස්වාමීන් වහන්සේ

පුණ්‍යානුමෝදනාවයි

ආරච්චිගේ අබේරත්න පියාණන්ට හා විමලා විතානගේ මෑණියන්ට නිරෝගී සුව හා දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමි.

ජනිත ඉන්දික පුතණුවන් විසින් මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණය කර ධර්ම දානය පිණිස බෙද දෙන ලදී.

ධර්ම දානය පිණිසයි.

බුෑව: 2554
ක්‍රිෑව: 2010

හඬා වැලපෙනවා නැවත සිනාසෙනවා

අපි හැම කෙනෙක්ම බොහෝ අවස්ථාවල මරණය ගැන අහලා තියනවා, කතා කරනවා, අපි ඕන තරම් මල ගෙවල් වල ගිහිල්ලා තියනවා, ඕන තරම් මැරුණු අය දැකලා තියනවා. ඒ වගේම මරණයේදී දුක ශෝකය ඇතිකරගන්නා අන් අයගේ සිත් සනසන්නට අපි ඕනෑ තරම් උපදෙස් දීලා තියනවා. නමුත් තමන්ට හෝ තමන්ට ආසන්න කෙනෙකුට මරණය පැමිණෙන කොට ඒක අපේ ජීවිතයට තදින් දැනෙනවා. ඒක මනසට කම්පනයක් ඇතිකරන්න, මනස වික්ෂිප්ත කරන්න, මනසට පීඩාවක් දුකක් අපහසුවක් ඇති කරන්න, සමත් වෙනවා.

බොහෝ මනුෂ්‍යයො දුකක් පීඩාවක් අපහසුවක් ඇති වුණාම කරන්නෙ ඒ මත්තේම හැපිලා, ඒ මත්තේම පැවතිලා, කායිකවත් දුබල වෙලා දෛනිකව කරන කටයුතුත් අතපසු කර ගන්නවා. සතියක් මාසයක් වැඩිම වුණොත් වසරක් විතර ඒ වෙනුවෙන්ම දුක් වෙනවා. පීඩා විඳිනවා. වසරක් පමණ ගත වෙනකොට අපට දෛනික ජීවිතය ඒ මියගිය අය වෙනුවෙන්ම හිත හිතා ගත කරන්නට බැරි වෙනවා. ඊට පස්සේ දෛනික ජීවිතයෙ සුපුරුදු ගැටළු ප්‍රශ්ණ අපි මත පැටවෙන කොට අපට අර සියල්ලම අමතක කරලා සුපුරුදු විදිහට ජීවත් වෙන්නට සිදු වෙනවා. ආයෙ අපි හිනාවෙනවා. සතුටු වෙනවා. මුදල් උපයනවා. ජීවත් වෙනවා. ආයෙත් අර වගේ දෙයක් සිදු වුණ වෙලාවට නැවතත් හඬා වැලපෙනවා. සතියක් හමාරක් මාසයක් පමණ ගතවෙනකොට නැවතත් අපට දෛනික ජීවිතය ගැන හිතන්න වෙනකොට මරණය ගැන හිත හිතා ඉන්නට වෙලාවක් නැති වෙනවා. ආපහු අපි දෛනික ජීවිතයේ ගැටළු වලට හුරු වෙනවා.

හේතු සෙවිය යුතුයි

මේක තමයි සාමාන්‍ය මිනිස්සුන්ගේ පැවැත්ම. එබඳු මනුෂ්‍යයෝ කිසිදාක ජීවිතය ගැන හඳුනා ගන්නේ නැහැ. මරණය ගැන හඳුනා ගන්නෙත් නැහැ. දුක දොම්නස ඇති වෙනකොට ඒ වෙනුවෙන් හඬා වැලපෙනවා විනා එය කෙසේ සිදු වුණාද, එය කෙසේ මා වෙත පැමිණුනාද කියන කාරණය පිළිබඳව බුද්ධිමත්ව

නොසිතන නිසා කවදාවත් ඒ තත්වය අවබෝධ කර ගෙන මනස හදා ගන්නට පුළුවන් කමක් නෑ. සතුට සොම්නස ඇති වෙන කොට ඒක කොහොමද තමන්ගේ ජීවිතයට පැමිණුනේ කියලා බුද්ධිමත්ව සිතා නොබලන නිසා එය දිගුකල් පවත්වා ගන්නට කිසිදාක ඔබට පුළුවන් කමක් නෑ. අහඹු විදිහට සොම්නස් වෙන්නට, සතුටු වෙන්නට මිනිස්සුන්ට පුළුවන්. අහඹු විදිහට දුක දොම්නස එනකොට එය දෝතින්ම අරගෙන හිස මත තියාගෙන හඬා වැලපෙන්නටත් පුළුවන්. නමුත් මේ දෙක සමබර කරගෙන ජීවිතය පවත්වන්නටයි බොහෝ මනුෂ්‍යයින්ට හැකියාවක් නැත්තේ. එම හැකියාව ඇතිකර ගන්නට නම් දුක ශෝකය හෝ සතුට සොම්නස හෝ ඇතිවන ආකාරය නුවණින් විමසා බලන්න ඕනෑ.

කෙනෙක් මිය පරලොව ගියාට පස්සෙ ඇයි අපට දුකක් ඇති වෙන්නෙ? ඇත්තටම කෙනෙක් මරණයට පත් වෙනවා කියලා කියන්නෙ මොකක්ද? ජීවත් වෙනවා කියලා කියන්නෙ මොකක්ද? ඒ වගේම උපදිනවා කියල කියන්නෙ මොකක්ද? මෙබඳු කරුණු පිළිබඳව අපි හැම දෙනාම බුද්ධිමත්ව සිතා බැලිය යුතුයි කියලයි තථාගතයන් වහන්සේ දේශනා කළේ. මරණය ගැන කල්පනා කරන්නට, මරණය ගැන හිතන්නට, ඒ පිළිබඳව කතා කරන්නට වත් අපි කවුරුත් කැමති නැහැ. ඒක අශුභවාදීවයි අපි දකින්නෙ. නමුත් අපි හැම දෙනාටම අනන්ත සසරේ හැම භවයකදීම නොවැරදීම අත් විඳින්නට ලැබෙන්නෙත් මෙයමයි. නමුත් අපි අකමැති වෙන දේත් එයමයි. අපි නොදන්න දේත් එයමයි.

හඳුනාගත්තොත් සහනය

තථාගතයන් වහන්සේ දේශනා කරනවා මේ නොදැනුවත් භාවය තමයි මරණය කෙරෙහි බියක් තැති ගැන්මක් ශෝකයක් දුකක් ඇති කර ගන්නට ප්‍රධාන හේතුව වෙන්නෙ. යම් කෙනෙක් මරණය ගැන හඳුනා ගන්නවා නම්, ජීවිතය ගැන හඳුනා ගන්නවා නම්, ලෝකය ගැන හඳුනා ගන්නවා නම්, උපත ගැන හඳුනා ගන්නවා නම් ඒ තැනැත්තාට අන් කෙනෙකුගෙ මරණයකදී දුකක් පීඩාවක් ඇති නොවී මනස සමහන් කරගන්නටත්, තමන්ගේ මරණයට නිදහස් මනසින් මුහුණ දෙන්නටත් එය ලොකු සවියක්

වෙනවා.

ඒ නිසා තථාගතයන් වහන්සේ දේශනා කරනවා - ''මරණ ධම්මොම්හි මරණං අනතීතොති අභිණ්හං පච්චවෙක්ඛිතබ්බං, ඉත්ථියාවා පුරිසේනවා ගහට්ඨෙනවා පබ්බජිතෙනවා" පැවිද්දෙක් විසිනුත් ගිහියෙක් විසිනුත් ස්ත්‍රියක් පුරුෂයෙක් විසිනුත් නිතර සිහි කළ යුතු ධර්මතා අතර එක් ධර්ම කාරණයක් තමයි ''මා තවම මිය ගොස් නැහැ, නුදුරු අනාගතයේ මා මරණය වෙත පැමිණිය හැකියි" කියන මේ කාරණය. අපි හැම දෙනා විසින්ම එක් මොහොතක් දෙකක් නෙමෙයි, නිතර නිතර සිහි කරන්නට කියලා දේශනා කළේ. අපි මරණය ගැන සිතන්නට කැමති නැත්නම්, අපි එය අශුභවාදීව කල්පනා කරනවානම්, එයට අපි අකමැති නම්, මේ අකමැති දේ ගැන නැවත නැවත සිතන්නටය කියලා ඇයි තථාගතයන් වහන්සේ දේශනා කළේ?

පින්වතුනි, අපි මරණය ගැන සිතන්නට අකමැති වෙන්නෙත්, මරණය ගැන අපට ශෝකය දුක හට ගන්නෙත්, මරණය ගැන භීතිය තැති ගැන්ම හට ගන්නෙත්, මරණය ගැන නොදන්නා නිසාමයි. යම් කෙනෙක් මරණය ගැන අවබෝධ කර ගන්නවද, ජීවිතය ගැන අවබෝධ කර ගන්නවාද, උපත ගැන අවබෝධ කර ගන්නවාද ඒ තැනැත්තාට මරණය කෙරෙහි තියෙන අනිසි බිය තැති ගැන්ම ශෝකය තුනී කරගෙන සහනදායීව සුවපත් ජීවිතයක් පවත්වන්නටත්, ඒ වගේම සුවපත්ව මරණයට මුහුණ දෙන්නටත් ශක්තියක් ලැබෙනවා. ඒ ශක්තිය අපි තුළ ගොඩ නගන්නට ඕනැ නිසයි තථාගතයන් වහන්සේ දේශනා කළේ මරණය ගැන නැවත නැවත සිහිපත් කරන්නට කියලා.

වචන මතුරලා මදි

එහෙම සිහිපත් කරන්නට කිව්වයින් පස්සේ මරණානුස්සති භාවනාවයි කියලා අපි මොකක්ද කරන්නෙ - ''**ජීවිතං අනියතං මරණං නියතං මරණං නියතං**" කියල නැවත නැවත සිහිපත් කරනවා. මෙයින් අපට මරණය ගැන කුමක්ද පින්වතුනි වැටහෙන්නෙ? එයින් අපට මරණය ගැන අවබෝධ වන කිසිවක් නැහැ. ඒ වචනය තුළ යම් කිසි සංහිඳියාවක් ඇතිවන්නට පුළුවන්. මනස සංසිඳවා ගන්නට එය උදවු වෙනවා. නමුත් මරණය ගැන

අවබෝධ කර ගන්නට එය ප්‍රමාණවත් වෙන්නෙ නැහැ.

මරණය ගැන අවබෝධ කර ගන්නට නම් ඇත්තටම මෙබඳු මොහොතක අපේ ජීවිතය ගැන ටිකක් ආවර්ජනා කරලා බලන්නට ඕනැ පින්වතුනි. අපි හැම කෙනෙක්ම ජීවිතේ බොහෝ අවස්ථාවල මැරුණු අය දැකල තියෙනවා. මරණය ගැන අපි කථා කරල තියෙනවා. මරණය ගැන අපි අහල තියෙනවා. අන් අයට මරණයෙ ස්වභාවය ගැන උපදෙස් දීලා තියෙනවා. නමුත් මේ හැම දෙයක්ම අපිට ජීවිතයේ තවත් එක් සිදුවීමක් විතරයි. තමන්ගෙම කෙනෙක් මැරුණහම, තමන්ට මරණයට මුහුණ පාන්නට සිදු වුණාම, අන්න එදාටයි අපට හැබෑවටම මේ මරණය හදවතට දැනෙන්නට පටන් ගන්නෙ. මේ සෑම සියළු දෙනාගෙන්ම, කුඩා දරුවන්ගෙන් පවා ඇහුවොත් 'ජීවත් වන ඕනම කෙනෙක් කෙළවර වෙන්නෙ කොහොමද' කියලා, පොඩි දරුවෙක් වුණත් දන්නවා මරණයෙන් තමයි කෙළවර වෙන්නෙ කියලා. ඉතින් අපි දන්නා දේ සිද්ධ වෙනකොට ඇයි අපට ඒක දරා ගන්න බැරි වෙන්නෙ? එය දැන ගත්තට සැබවින්ම අපි එය වටහා ගෙන නැහැ. අපි වටහා ගත්තට එයට මුහුණ දෙන්නට අවබෝධයක් අපේ සිත් සතන් තුළ ඇති වෙලා නැහැ. ඒ නිසා තථාගතයන් වහන්සේ දේශනා කරනවා මරණය ගැන අවබෝධ කර ගන්නට හොඳම අවස්ථාව තමයි තමන්ගෙ හදවතට ගැඹුරින් එය දැනෙන අවස්ථාව.

අත්දැකීම් වටිනාවා

අපි පැවිද්දො හැටියට කොයි තරම් මහජනයාට මරණය ගැන දේශනා කළත්, මේ මරණය ගැන තදින්ම දැනෙන අවස්ථා ඉතා කලාතුරකිනුයි තියෙන්නෙ. මගේ ජීවිතයෙත් එබඳු අවසථා කීපයක් තියනවා.

එකක් තමයි අපේ විහාරස්ථානයේ වැඩ හිටිය කල්‍යාණ ධම්ම ලොකු හාමුදුරුවො අපවත් වුණු අවස්ථාව. රාත්‍රියේ බොහොම හොඳට කථා කරලා හිනා වෙලා සතුටින් ගිහින් උන් වහන්සේ සැතපුනා. පසුවදා උදේ බලනකොට දොරකඩ උන් වහන්සේගෙ මළ සිරුර. එදා තමයි මගේ ජීවිතයට ගොඩාක් සමීපව සිටි, මම ගරු කරපු ඒ වගේම දීර්ඝ කාලයක් ජීවත් වේවිය කියලා බලාපොරොත්තු වුණු එක්තරා පුද්ගලයෙකුගෙ අභාවය,

මගේ මනසට තදින්ම කම්පනයක් ඇති කරපු පළවෙනි අවස්ථාව.

තවත් අවස්ථාවක අපට ඉතාමත්ම හිතවත්ව, දුකේදීත් සැපේදීත් අපට මේ පැවිදි ජීවිතය හොඳින් පවත්වන්නට බොහෝ සහය වුණු එක්තරා ගිහි මහත්මයෙක් හිටියා, පියකෙනෙක් හා සමානව අපට සහාය වුණු ඒ තැනැත්තා හදිසියේ අභාවයට ගියා. ඒ මොහොතේත් ඒ හා සමාන කම්පනයක් දැනුණා. මේ අවස්ථා දෙක තමයි මට මරණය ගැන හිතන්න බොහොම හොඳට මනස යොමු වුණු අවස්ථා.

තව එක් අවස්ථාවක් තියෙනවා මාව මිය යාවි කියලා හදිසියේ තැති ගත්ත අවස්ථාවක්. මේ අවස්ථා තුන තමයි ජීවිතය ගැන ලෝකය ගැන මරණය ගැන හැබෑවටම අවංකවම ආවර්ජනා කර බලන්න උදව් වුණේ.

හොඳම අවස්ථාවක්

අනිත් හැම විටම අපි ඕනෑ තරම් අය මැරිලා ඉන්නවා දැකල තියෙනවා. මරණය ගැන අපි කථා කරලා තියෙනවා. මරණයෙ ස්වභාවය ගැන අන් අයට උපදෙස් දීලා තියෙනවා. අන් අයට චිත්ත පීඩා ඇති වුණු අවස්ථාවල ඒ අයට මනස සමහන් කර ගන්නටත් අපි අවවාද අනුශාසනා කරලා තියෙනවා. නමුත් හැබෑවටම අපේ මනසට ඒක තදින් දැනුණු මොහෙතේදි තමයි කොයි තරම් දුකක් වේදනාවක් ඒ තුළ තියෙනවද කියන බව හරියටම අවබෝධ වෙන්නෙ.

බුදුරජාණන් වහනසේ දේශනා කරනවා අන්න ඒ අවස්ථාව තමයි අවංකවම මරණය ගැන හිතන්න හොඳම අවස්ථාව. එහෙම නැති අවස්ථාවල අපි මරණය ගැන කියෙව්වට වචන ටිකක් විතරයි. අපි මරණය ගැන හිතන්නට පෙලඹුනාට අපිට තවත් එක්තරා සිදුවීමක් විතරයි. අපි ඕනෑ කෙනෙකුට කියන්න පුළුවන් ඕක සාමාන්‍ය දෙයක්නෙ, ඕක කාටත් වෙන දෙයක්නෙ, කවුරුත් මැරෙනවනෙ, ඒ නිසා හිත හදා ගන්න කියලා. මේ වචන ටික අපි කාටත් කියන්න පුළුවන්. නමුත් ඒ අවස්ථාවට මුහුණ දෙන කොට, අන්න ඒ මොහොතෙදි තමයි ඇත්තටම එය කෙබඳු

දෙයක්ද කියලා අපේ මනසට දැනෙන්නෙ.

ඒ නිසා පින්වතුනි කෙනෙකුගෙ අභාවය කියන එක අපිට ජීවිතයම අවබෝධ කර ගන්නට තියෙන භාග්‍ය සම්පන්න අවස්ථාවක්. එය කිසි සේත්ම අපි අපතේ නොහැරිය යුතුයි. එය කිසි සේත් අපි අමතක නොකළ යුතුයි. ඇයි අමතක නොකළ යුතුයි කියන්නෙ? එය නිතර නිතර සිහි කර කර හඬා වැලපෙන්නට නෙමෙයි. ජීවිතය ගැන අවබෝධ කර ගන්නට, ජීවිතය ගැන වටහා ගන්නට. අපේ මනසට එය තදින් කා වදින හොඳම අවස්ථාවක්. පින්වතුන් අහලා ඇති සිද්ධාර්ථ කුමාරයා සතර පෙර නිමිති දැකලා ජීවිතය ගැන කලකිරිලා ගිහිගෙයින් නික්මුණාය කියලා. ලෙඩෙක් දැක්කා, මහල්ලෙක් දැක්කා, මළ මිනියක් දැක්කා, පැවිදි රුවක් දැක්කා. මේ කථාව කියන කොට ඇතැම් අය අනුමාන කරනවා, එහෙනම් සුද්ධෝදන රජ්ජුරුවෝ ලෙඩ්ඩු දකින්නට තියන්න නැතිව ඇති, මහල්ලො දකින්නට තියන්න නැතිව ඇති, මැරුණු අය දකින්නට තියන්න නැතිව ඇති, ඔක්කොම අයින් කරලා තියන්න ඇති කියලා. එහෙම දෙයක් නෙමෙයි පින්වතුනි. හැමදාම අපි ලෙඩ්ඩු දැක්කත්, හැමදාම අපි මියගිය අය දැක්කත් අපේ මනසට එය තදින් කා වදින එක්තරා අවස්ථාවක් තියෙනවා. ජීවිතයේ සුවිශේෂම අවස්ථාවක්. අපේ මනස පරිවර්තනය කරන්නට පුළුවන් අවස්ථාවක්, අපිට ජීවිතය ගැන තදින් හිතන්නට පුළුවන් අවස්ථාවක් ජීවිතයේ කලාතුරකින් උදා වෙන්නේ.

අවබෝධයට සහායක්

එහෙමනම් සිද්ධාර්ථ කුමාරයාටත් වුණේ වෙනදා දකින දේට වඩා අමතරව තමන්ගේ කුසල බලය ඉස්මතු වීමත්, ඒ වගේම තමන්ගේ ප්‍රඥාව මුහුකුරා යාමත් මත ලෝකයේ යථාර්ථය විනිවිද යන්නා වූ මහා ගැඹුරු ඥානයක් පහල කර ගන්නට, ලෝකයේ යථාර්ථය පිළිබඳව ගැඹුරින් හිතන්නට උන් වහන්සේගේ මනස පෙළඹුනා ඒ අවස්ථාවේදී. ඒ නිසයි ගිහිගෙය අතහැරලා යන්නට තීරණය කළේ. ඒ විදියට ගිහිගෙය අතහැරලා නොග යත්, මේ ජීවිතයේ අවබෝධයෙන් ජීවත් වෙන්නට අපටත් මෙබඳු අවස්ථාවන් උපකාර වෙනවා.

අපි ඇසුරු කරන එක්තරා දොස්තර මහත්මයෙක්, එතුමාගේ මැණියන්ට බොහොම සෙනෙහසින් කටයුතු කළා. හදිසියේ ඒ මැණියන් අභාවයට ගියා. මැණියන්ගේ අභාවය නිසා දීර්ඝ කාලයක් ඒ ගැනම කථාකරන්නට, හිතන්නට ඔහු පෙළඹුනා. අන්‍ය වෛද්‍යවරු ඔහුට කියනවලු; දැන් ඉතින් ඕක අමතක කරලා දාන්න, දැන් ඔය ගැන හිතන්නට දෙයක් නැහැ, දැන් සුපුරුදු විදියට ජීවිත් වෙන්න කියලා. එතනදි ඒ තැනැත්තා මා සමඟ කියනවා, හාමුදුරුවනේ මගේ යාළුවෝ මා සමඟ මෙහෙම කියනවා. ඇයි මම මගේ අම්මගේ මරණය අමතක කරන්නෙ? ඇයි හාමුදුරුවනේ එය මට ජීවිතය ගැන හිතන්නට, ලෝකය ගැන හිතන්නට, මරණය ගැන හිතන්නට හොඳ අවස්ථාවක් නේද? ඇයි මම මේක අමතක කරන්නෙ කියලා.

මෙහෙම හිතන්නට යමෙකුට පුළුවන් නම්, කෙනෙකුගෙ අභාවයෙන් අපට මේ ජීවිතය පිළිබඳව බොහෝ දේ ඉගෙන ගන්නට පුළුවන්. ලෝකයේ සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙ ස්වභාවය තමයි දුක් වෙන්නට කරුණක් පැමිණුනාම දුක් වෙනවා, හඬා වැලපෙනවා. සතුටු වෙන්නට කරුණක් පැමිණුනාම සතුටු වෙනවා, උද්දාම වෙනවා. නමුත් ඒවා එහෙම සිදු වෙන්නෙ කොහොමද කියලා විමසා බලන්න පෙළඹෙන්නෙ නැහැ. එබඳු පුද්ගලයෝ කිසිම දාක ජීවිතය ගැන අවබෝධ කර ගන්නෙ නැහැ. කිසිම දාක ජීවිතයේ යථාර්ථය දකින්නෙ නැහැ.

අවැසි තැනටයි අවැසි

බුදුරජාණන් වහන්සේ දේශනා කළේ මරණය සිදු වූ මොහොතේ, එයට මුහුණ දුන් මොහොතේ සමහන් සිතින් මැදහත් සිතින් එහි යථාර්ථය දකින්නට අපට පුළුවන් නම්, ජීවිතයේ ගැටළු මතු වෙද්දි මැදහත් සිතින් අපට ඒවාට මුහුණ දෙන්නට පුළුවන් නම්, අන්න ඒ තැනැත්තා ශක්තිමත් මනසකින්, ධර්මය පිළිබඳ අවබෝධයකින් කටයුතු කරන කෙනෙක්ය කියලා හඳුන්වන්න පුළුවන්. ජීවිතයේ ගැටළු මතු වන මොහොතේදි ඒ තුළින් දහම දකින්නට බැරිනම් පින්වතුනි අපි ප්‍රගුණ කරන්නාවූ දහමින් පලක් නැහැ. ප්‍රශ්නයක් ඇති වූ මොහොතක එය විසඳා ගන්නට අපට

දැනුම නැතිනම්, අපට නුවණ නැතිනම් අපි දන්නා දෙයින් අපේ ඥානයෙන් අපට පලක් නැහැ. ඒ වගේම දුකක් දොම්නසක් ඇතිවූ මොහොතක එය දරා ගැනීමට අපට බැරිනම්, අපසතු දරාගැනීමේ ශක්තියෙන් කිසිදාක පලක් නැහැ. ඒ අප සන්තක ශක්තියෙන් ප්‍රයෝජන ගන්නට නම්, අනිවාර්යයෙන්ම අවශ්‍ය තැනදි අවශ්‍ය ශක්තිය මතුකර ගන්නට පුහුණු වෙන්න ඕනැ. ජීවිතය ගැන ආවර්ජනා කරද්දි නිදහස් මනසින් දකින්න ඕනැ. එසේ දකින්නාවූ තැනැත්තා නිවැරදිව ජීවිතය ගැන අවබෝධ කර ගන්නව, මරණය ගැන අවබෝධ කර ගන්නව. ඒ තැනැත්තාට අනුන්ගේ මරණය පමණක් නෙවෙයි තමන්ගේ මරණයටත් සමහන් සිතින් මුහුන දෙන්නට පුළුවන්.

පිටු පෙරලීමක් පමණයි

ඇත්තටම පින්වතුනි මේ ජීවිතය කෙලවර වෙන්නෙ කොහොමද කියල අපි අවබෝධ කරගන්නව නම්, මරණය කියල කියන්නෙ මොකක්ද කියල හඳුනා ගන්නව නම් එය ඉතාම සරල දෙයක් බවට පත්වෙනවා. නිදාගෙන අවදි වෙන්නා හා සමාන අතිශයින් සරල දෙයක්. කෙනෙක් අභාවයට ගිහින් නැවත ඉපදෙනවාය කියන්නෙ, ඇඳගෙන ඉන්න ඇඳුමක් ඉවත් කරලා අළුත් ඇඳුමක් ඇඳ ගන්නා හා සමාන අතිශයින් සරල දෙයක්. පින්වතුනි මැරෙණවාය කියල කියන්නෙ මොකක්ද? සියල්ල අහිමි වෙනවා නොවෙයි. මේ ජීවිතය, මේ පවතින්නාවූ කය අතහැර තවත් කයක් ලැබීමක් පමණයි. පරිනිර්වාණයට පත් වෙන තෙක් අපට නොඉපදීමට පුළුවන් කමක් නැහැ. එතෙක් අපි හැම ආත්ම භවයකදීම මැරුණු සැනින් ඊලඟ චිත්තක්ෂණයෙදි උපදිනවා. එය වලක්වන්නට පුළුවන් කෙනෙක් නැහැ. එය නවත්වන්නට පුළුවන් කෙනෙක් නැහැ. අර්හත්වයට පත්වූ උතුමෙක් හැරෙන්නට මේ තත්වය ජය ගන්නට පුළුවන් කිසිම පෘථජ්ජනයෙක් මිහිපිට පහල වී නැහැ පින්වතුනි. ඒ නිසා තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ අපි හැම දෙනාටම මේ ස්වභාවය මැනවින් අවබෝධ කරගන්නට නම් නිතර නිතර ජීවිතය ගැන මරණය ගැන ආවර්ජනා කරල බලන්න කියල.

හැඬීමේ රහස

අපි ජීවිතය ගැන ආවර්ජනා කරල, මරණය ගැන ආවර්ජනා කරල හඳුනා ගන්නව නම් අපටත් පුළුවන් නිදහස් මනසින් ඒ දිහා දකින්නට. නිදහස් මනසින් අපිට එය දකින්නට පුළුවන් නම් සැබැවින්ම අපිට මෙහි ඇති සත්‍ය ස්වභාවය අවබෝධ කරගෙන ජීවිතය පවත්වන්නට පුළුවන්. පින්වතුන් අහල ඇති ක්‍රිෂ්ණමූර්ති කියල ඉන්දියාවෙ පහල වුණු මහා දාර්ශනිකයෙක් හිටියා. ඒ තැනැත්තා බෞද්ධයෙක්ය කියල තමන්ව හඳුන්වා ගන්නෙත් නැහැ. අන්‍ය ආගමිකයෙක්ය කියලා හඳුන්වා ගන්නෙත් නැහැ. නමුත් බෞද්ධ වූ අපි ඔහුගේ දර්ශනය ගැන ඇසුවොත් අපිට හිතෙන්නෙ මේ කොයිතරම් හොඳ බෞද්ධයෙක්ද කියලා. නමුත් ඔහුගෙන් ඇහුවම බෞද්ධ පොත පත කියවල තියනවද කියලා, ඔහු කියන්නෙ ධම්ම පදය වැනි පොඩි පොතක් දෙකක් හැරෙන්නට බුද්ධාගමේ පොත් වැඩිපුර කියවල නෑ කියලා. නමුත් ඔහුගේ දේශනා අහල බැලුවොත්, බුදුහාමුදුරුවො දේශනා කළ ගැඹුරු ධර්මය ඔහුගේ දේශනා වල අන්තර්ගත වෙනවා.

කොහොමද මේ ගැඹුරු ඥානය ලැබුවෙ? ඔහු තමන්ගේ සහෝදරයා සමඟ එංගලන්තයේ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනය ලබන කාලයේ කෙටි නිවාඩුවකට ඉන්දියාවට ආවා තමන්ගේ නිවසට. හදිසියේ තමන්ගේ සහෝදරයා මිය ගියා. ඒ මිය ගිය අවස්ථාවේ කිසි දාක නොදැනෙන තරම් මහා වේදනාවක් කම්පාවක් තමන්ගේ හදවතට දැනුනා. අන්න එදා ක්‍රිෂ්ණමූර්ති කල්පනා කළා ඇත්තටම මේ ලෝකෙ කොයි තරම් මිනිස්සු මිය ගියත් ඒ කවදාවත් නොදැනෙන වේදනාවක් ඇයි මට අද දැනුනෙ. ඇයි අනෙක් මනුෂ්‍යයො මැරුණහම මට මෙහෙම වේදනාවක් නොදැනෙන්නෙ. ඇයි මගේ සහෝදරයා මැරුණහම විතරක් මේ වේදනාව දැනුනෙ. මේ ගැන නැවත නැවත ගැඹුරින් කල්පනා කරද්දී ඔහුට කිසි දාක නොවැටහුණු වටිනා කාරණයක් අවබෝධ වුණා.

මොකක්ද අවබෝධ කර ගත්තේ? ඇත්තටම අපි හඬා වැලපෙන්නෙ කෙනෙකුගෙ අභාවය නිසා නොවන බව. කුමක් නිසාද එහෙනම් අපි හඬා වැලපෙන්නෙ? කෙනෙකුගෙ අභාවය නිසා අපි හඬා වැලපෙනවානම් මේ ලෝකෙ ජීවත් වෙන මිනිස්සු

කොතරම් මිය යනවාද, ඒ හැම දෙනා ගැනම හඬා වැලපෙන්නට ගියොත් අපට වෙනත් වැඩක් කරන්නට කාලයක් ඉතිරි වෙන්නේ නැහැ. එහෙනම් ඇයි අපි හඬා වැලපෙන්නෙ? තමන්ගේ කියන පුද්ගලයො පිළිබඳව අපි නොයෙකුත් සිතුම් පැතුම් මනසින් ගොඩ නගාගෙන තියෙනවා. ඔවුන් හා සම්බන්ධව අපි අපේ මනසින් වෙනම ලෝකයක් ගොඩ නගාගෙන තියෙනවා. ඔවුන්ගේ අභාවය නිසා, අපි මනසින් ගොඩ නගපු ලෝකය බිඳී යනවා. එයට අපි කැමති නැහැ. ඒ අකමැත්ත අපේ හදවත තුළින් උතුරා යනවා. එය කඳුළු සොටු හැටියට, කායික පීඩාවක් හැටියට, මානසික පීඩාවක් හැටියට අපේ කයින් බැහැර වෙනවා.

සිතුවිලිවල ගැටුමක්

කුමක්ද මේ ආවේගය? අපේ සිතුවිලි සමග ඇතිවන ගැටුම. කෙනෙකු අභාවයට යාමෙන් ඒ පුද්ගලයා සමඟ ගොඩ නගා ගෙන හිටපු මානසික ලෝකය පළුදු වෙනවා කියලා අපි ස්ථිරවම දන්නවා. මෙහෙම හිතලා බලන්න. අපි හිතමු විදේශ රටක කෙනෙක් අභාවයට යනවා. ඒ තමන්ගේ ඉතාම හොඳ මිත්‍රයෙක් කියලා හිතමු. අපි දන්නේ නැහැ ඔහු මරණයට පත් වුණාද කියලා. දැන් ඇත්තටම අපට දුකක් තියෙනවද? නමුත් ඒ තැනැත්තා අභාවයට ගියා කියලා දැන ගත් දවසෙයි අපට දුක හට ගන්නේ. ඒ වෙනකොට අභාවයට ගිහිල්ලා වසරක් වෙන්නට පුළුවන්, දෙකක් වෙන්නට පුළුවන්, තුනක් වෙන්නට පුළුවන්. ඒ මුල් වසර දෙක තුනේ නැති මහා චිත්ත පීඩාවක් අර කාරණය දැනගත් සැනින්ම අපේ මනසේ ගොඩ නැගෙනවා. සැබවින්ම ඒ අපට දුක පීඩාව හට ගන්නේ මරණය නිසාද පින්වතුනි. මරණය නිසා නොවේ. ඔහුගේ අභාවය පිළිබඳ අකමැත්ත අපේ මනසේ නැවත නැවත ඇතිවන නිසා. එම යථාර්ථයට එකඟ වෙන්න බැරි කමත්, ඊට වඩා වෙනස් දෙයක් අපේක්ෂා කිරීමත් නිසා ඇතිවන මානසික ගැටුම තමයි අපි දුක ශෝකය ලෙස හඳුන්වන්නේ.

ඒ නිසා තථාගතයන් වහන්සේ දේශනා කළා මේ හැබෑව හඳුනා ගන්නවා නම් අපට ලෝකය ගැන, තමන්ගේ මනස ගැන බොහෝ දේ අවබෝධ කර ගන්නට පුළුවන් කියලා. එදා ක්‍රිෂ්ණමූර්ති මේ පිළිබඳව ආවර්ජනා කළා. නිදහස්ව කල්පනා කළා.

එසේ කල්පනා කරද්දි ඔහු බොහෝ දේ වටහා ගත්තා තමන්ගේ මනස ගැන. තමන්ගේ මනස තමාව රවටන හැටි ඔහු හඳුනා ගත්තා. තමන්ගේ මනස තමන්ට පීඩා දෙන හැටි ඔහු හඳුනා ගත්තා. ඇත්තටම අපේ මනස විසින් ගොඩ නගන්නා වූ සිතුවිලි වලිනුයි අපි මේ පීඩාව ඇති කර ගන්නේ. අපි යමක් දිහා බලන ආකාරය මතයි හිතේ දුක දොම්නස ඇති කර ගන්නේ. අපි යමක් දිහා බලන ආකාරය මතයි ජීවිතයේ සතුට ඇති කර ගන්නේ.

වැරදියට සිතීම ලොකුම වරදයි

පින්වතුන් දන්නවා ඇති අහලා ඇති පටාචාරාවට කොයි තරම් විපතක් වුණාද කියලා. ඇයි අපි ඒකට විපතයි කියලා කියන්නේ? ඇයට තිබුණ සියල්ලම නැති වුණා. තමන්ගේ සැමියා නැති වුණා, දරුවො දෙන්නම නැති වුණා, අම්මා නැති වුණා, තාත්තා නැති වුණා, සහෝදරයා නැති වුණා, ගේ දොර නැති වුණා. නැතිවෙන්නට තියෙන සියල්ලක්ම නැති වුණා. ඒ නිසා අපි කියනවා එය මහා අභාග්‍යයක්ය කියලා. ඇයත් හිතුවා මහා අභාග්‍යයක් කියලා. නැවත නැවත කල්පනා කළා - අනේ ඇයි මට මෙහෙම වුනේ? මම කාටද වරද කළේ? කිසිවකුට වරදක් නැතිව අහිංසකව ජීවත් වෙච්ච අපට ඇයි මෙහෙම සිද්ධ වුනේ? මගේ ස්වාමියා කාටද වැරද්දක් කළේ? මගේ දරුවන් කාටද වැරද්දක් කළේ? අනේ ඇයි අපට මෙහෙම සිද්ධ වුනේ කියලා නැවත නැවත හිතනකොට ඒ සිතිවිලි තුළින් මහා අසහනයක්, වේදනාවක් මනස තුළ ගොඩ නැගුනා.

ඇය කල්පනා කරනවා, අනේ මගේ දරුවා එහා පැත්තෙ තියලා අනෙක් දරුවා ගන්න මම මෙහා ගොඩට නොආවානම් හොඳයි. අනේ මම මේ ජල කඳ මැදට නොගියානම් මගේ දරුවන් දෙන්නා කවදාවත් ගහගෙන යන්නෙ නැහැ. අනේ මගේ ස්වාමියා තනියම කැළෑවට නොයැව්වානම් කවදාවත් මේ විපත්තිය වන්නෙ නැහැ. මම හිතුවක්කාර කමට මේ විවාහය නොකර ගත්තා නම් කවදාවත් මේ විපත වෙන්නෙ නැහැ නේද කියලා, මෙසේ සිදු නොවුණු දේවල් ගැන නැවත නැවත හිත හිතා මෙහෙම නොවුනානම් මෙහෙම වෙන්නෙ නැහැ නේද කියලා අර සිදු වුණු සිදුවීම් ප්‍රතික්ෂේප කරමින් ඊට ප්‍රති විරුද්ධ දේ නැවත

නැවත හිතන්න හිතන්න මොකද වෙන්නේ? මනස පීඩා කරන ගත පීඩා කරන මහා අසහනයක් සන්තානය තුළ ගොඩ නැගුනා. අන්න ඒක තමයි දුක ශෝකය හැටියට ඇයගේ මනස විකෘති කළේ. එහි ප්‍රතිඵලය වුනේ කුමක්ද? තමන්ගේ මනසේ පාලනය තමන්ට නැතිව උම්මත්තක භාවයට පැමිණෙන්නට ඒ මානසික පීඩාව හේතු වුණා.

කුමකින්ද ඒ මානසික පීඩාව ඇති කළේ? තමන් සිතූ ආකාරය තුළින්. හිතලා බලන්න අපේ ඥාතියෙක් ගැන - ඒක නොවුනානම් හොඳයි, මෙහෙම වුනානම් හොඳයි කියලා නැවත නැවත ආවර්ජනා කරන තාක් කල් මොන තරම් අසහනයක් ඇති වෙනවද? මෙසේ පිස්සියක් බවට පත්වෙලා තමන්ගේ මානසික පාලනය වත් තමන්ට නැතිව උම්මත්තක ස්වභාවයෙන් කටයුතු කරද්දී තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, නැගණියනි, අපි ලෝකයේ සිදුවෙන දේවල් ගැන අයථා ආකාරයෙන් කල්පනා කළොත් අපට දුක ශෝකය හට ගන්නවා. අපිට ලෝකයේ සිදු වෙන සිදුවීම් පිළිබඳ යථා ස්වභාවයෙන් දකින්නට පුළුවන් නම්, සැබවින්ම අපට සහනය සතුට උදා කර ගන්නට පුළුවන්. එය මනස රවටා ගැනීමක් නෙවෙයි. මේ ලෝකයේ පවතින ඇත්ත එයයි. කවදාවත් ලෝකය ගැන වැරදි විදියට හිතන තාක් කල් සැනසීමක් ලබන්නට බැහැ. පටාචාරාව තමන්ගේ සැමියා ගැන දරුවන් ගැන මවුපියන් ගැන වැරදි විදියට හිතනතාක් කල් කවදාවත් ඇයට සහනයක් ලැබුනේ නැහැ.

සොබාදහම

ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, නැගණියනි මේ ලෝකයේ දේවල් සිදු වෙන්නෙ අපේ ඕනෑ කමට නෙමෙයි. අපි කැමති ආකාරයටවත් අපි අකමැති ආකාරයටවත් නෙවෙයි. ලෝකේ ගොඩනැගෙන හේතු වලට අනුවයි ඵලය සිදු වෙන්නෙ. කර්ම නියාම, චිත්ත නියාම, බීජ නියාම, ඍතු නියාම, ධම්ම නියාම යන මේ හේතු පහක් මේ ලෝකයේ තියෙනවා. මේ පංච හේතූන්ට අනුකූලවයි ලෝකය තුළ ඵල හට ගන්නේ. කෙනෙක් රැගෙන එන්නාවූ ආයු කාලය, කෙනෙක් රැගෙන එන්නාවූ කර්ම ශක්තිය මත ඒ තැනැත්තාගේ ජීව කාලය තීරණය වෙනවා. කෙනෙක් පවතින්නාවූ පැවැත්ම මත ඔහුගේ ජීව කාලය තීරණය වෙනවා. එහෙම නැතිව තමන්ගේ කැමැත්තටවත් ඔහුගේ කැමැත්තටවත් බුදුහාමුදුරුවන්ගේ කැමැත්තටවත් දෙවියන් වහන්සේගේ කැමැත්තටවත් නෙවෙයි ලෝකයේ දේවල් සිද්ධ වෙන්නෙ. මෙන්න මේ හේතුවට අනුව මෙන්න මේ ඵලය ගොඩ නැගෙනවා කියලා බුදුරජාණන් වහන්සේ මේ ලෝකයේ සොභාදහම පිළිබඳව ධර්ම දේශනා කළා. ඒ දම් දෙසුම අසා ගෙන ඉඳලා ඇය කල්පනා කරනවා, සැබෑවක් නේද, මම කැමති වුණා කියලා හෝ මම අකැමති වුණා කියලා වෙනසක් නැතිව ලෝකයෙ දේවල් සිදුවෙනවා.

පින්වතුනි කෙනෙක් අභාවයට ගියහම හඬා වැළපීම නිසා ඔහුට හෝ ඇයට නැවත ජීවය ලැබෙනවානම් අපි වසරක් නමෙයි වසර දහයක් හැඬුවත් වරදක් නැහැ. එය එසේ නොවනවානම් හඬා වැළපීම තුළින් අපට කළ හැක්කේ කුමක්ද? මිය ගිය කෙනා එය දකිනවානම් ඔහුටත් අසහනයක් ඇතිවෙනවා පමණයි. ජීවත් වෙලා ඉන්න තමන්ටත් එය අසහනයක් පමණයි. දකින අහන ඇසුරු කරන සියළු දෙනාම අසහනයට පමුණුවන, චිත්ත පීඩාව ඇති කරන, දුක දොම්නස ඇති කරන, දෛනික ජීවිතයේ සියළු වැඩ කටයුතු අඩාල කරන, ජීවිතය අභාග්‍ය සම්පන්න කරන තවත් එක් සිදුවීමක් විතරයි හඬා වැළපීම. එයින් කළ හැකි කිසිවක් නැහැ.

අභාග්‍යය තුළින්ම භාග්‍යය !

ඒ නිසා අපට පුළුවන් නම් ලෝකය ගැන නිවැරදිව හිතන්නට, අන්න එතනදි ලෝක ස්වභාවය වැටහෙනවා. ඒ නිසා පටාචාරාව එදා කල්පනා කරනවා මගේ ස්වාමියාගේ ජීවිතය රැක ගන්නට මගේ දිවි දෙන්නට පුළුවන් වුණා නම් මම එය කරනවා. නමුත් එහෙම කරන්නට පුළුවන් දෙයක් නෙවෙයි මේ ජීවිතය කියලා කියන්නෙ. තම තමන් ගෙනා කුසල අකුසල කර්ම ශක්තිය අනුව ඔවුනොවුන්ගේ මරණය සිදුවෙනවා නේද කියලා මේ කරුණු ගැන නිදහසේ සිතද්දී, තමන්ගේවත් අනුන්ගේවත් ඕනෑ කමට නොවෙයි, හේතු ඵල ධර්ම නියාමය මත ලෝකයේ දේවල් සිදුවෙනවාය කියන අවබෝධය මනස තුළ තහවුරු වෙද්දී, ඇය ඒ දුකින් පමණක් නෙවෙයි අපමණ සාංසාරික දුක් වලින් නිදහස් වෙලා සෝවාන් ඵලය සාක්ෂාත් කර ගත්තා. පසුව අර්හත්

ඵලයට පැමිණුනා.

අරහත් ඵලය සාක්ෂාත් කර ගත්තා වූ පටාචාරාව ලැබුවේ භාග්‍යයක්ද අභාග්‍යයක්ද? ඇය මහා භාග්‍යයක් සිද්ද කර ගත්තා. කෙනෙකුට කෙලෙසුන් නසා රහත් වෙන්නට පුළුවන් නම් ඒ ජීවිතේ ලබන මහා භාග්‍යයක්. දැන් මේ මහා භාග්‍යය ලැබුවේ කුමක් නිසාද පින්වතුනි? සැමියාගේ මරණය නිසා. දරුවන්ගේ මරණය නිසා. තමන්ගේ මවුපියන්ගේ මරණය නිසා. ඒ මරණයම ඇයට මහා භාග්‍යයක් ඇති කළා. ඒ මරණයම ඇයට මුලදී මහා අභාග්‍යයක් ඇති කළා. ඇය උම්මත්තක භාවයට පත් කළා. ඇයට තමන්ගේ මනසේ පාලනය නැති තත්වයට, උමතු තත්වයට පත් කළා. නමුත් ඒ ගැන නිවැරදිව හිතනකොට ඒ සිදුවීමම ඇයට මුළු සසර ගමනේම භාග්‍යය උදා කළා. එහෙමනම් නිකමට හිතලා බලන්න කෙනෙකුගේ මරණය භාග්‍යයක්ද අභාග්‍යයක්ද? ඒ මරණය පිළිබඳව අපි දකින ආකාරය මත මුළු ජීවිතයම විනාශ කරන අභාග්‍යයක් වෙන්නටත් පුළුවන්. ඒ මරණය ගැන දකින ආකාරය මත මුළු ජීවිතයම ජය ගන්න මහා භාග්‍යයක් කර ගන්නටත් පුළුවන්. ඒ නිසා ලෝකයේ භාග්‍යයයි අභාග්‍යයයි කියලා වෙන් කළ හැකි කිසිවක් නැහැ පින්වතුනි.

ලෝකයෙ සැපය දුකය කියලා වෙන් කළ හැකි කිසිවක්ම නැහැ. ඕනෑම දෙයක් සැප හෝ දුක වෙන්නෙ, ඕනෑම දෙයක් භාග්‍යය හෝ අභාග්‍යය වෙන්නෙ, ඕනෑම දෙයක් වාසනාව හෝ අවාසනාව වෙන්නෙ ඒ පිළිබඳව අපි සිතන සහ මුහුණ දෙන ආකාරය මත විනා එය සිදුවෙන ආකාරය මත නොවේ. කෙනෙක් මිය යනවා කියන්නෙ භාග්‍යයක්වත් අභාග්‍යයක්වත් නෙවෙයි. මෙලොව උපන්නාවූ සත්වයාගේ ආයු කාලය අවසන් වෙනකොට ඒ හේතුවට අනුව ඒ ඵලය සිදුවෙනවා. අභාවයට යනවා. නමුත් එය දකින ආකාරය මත, එයට මුහුණ දෙන ආකාරය මත, එය ඕනෑ නම් කෙනෙකුට භාග්‍යයක් කර ගන්නත් පුළුවන්. අභාග්‍යයක් කර ගන්නත් පුළුවන්. ඒ නිසා ජීවිතයේ සිදු වෙන ඕනම සිදුවීමක් දිහා නිවැරදිව දකින්නට පුළුවන් නම් ජීවිතය ජය ගන්නට මහා ශක්තියක් ඒ තුළින් ඇතිවෙනවා.

අඳුරටද? ආලෝකයට ද?

පසු ගිය කාලයේ මුහුද ගොඩ ගලලා මහා විනාශයක් සිදු වුණා. මෙය ඇත්තටම භාග්‍යයක්ද අභාග්‍යයක්ද? අපි දකින හැටියට ඒක මහා අභාග්‍යයක්. ඇයි? එක විනාඩි කීපයක් ඇතුළත ලක්ෂ ගණනක් මිනිසුන්ගේ ජීවිත බිලි ගත්තා. නමුත් මේ සිද්ධියට මුහුණදීලා මුළු ජීවිත කාලයම අවාසනාවන්ත කර ගත්තු අයත් ඉන්නවා. මුළු ජීවිත කාලයම වාසනාවන්ත කර ගත්තු අයත් ඉන්නවා. ඒ කොහොමද? ඇතැම් කෙනෙක් කල්පනා කරනවා මගේ ස්වාමියා හෝ බිරිඳ මේ ජල කඳට අහු වෙලා, මමත් මේ ජල කඳට අහු වෙලා, මගේ මවුපියොත් අහු වෙලා, ගේ දොර ඉඩ කඩම් සියල්ල ගසා ගෙන ගිහින්, ඒත් මම තවම ජීවත් වෙනවා. අනෙක් සියල්ල අහිමි වෙලා, මම විතරක් කොහොමද මේ ලෝකෙ ඉතිරි වුණේ? මම ආරක්ෂා කරන්නාවූ යම් ප්‍රතිපත්තියක් නිසා, මම ආරක්ෂා කරන්නාවූ යම් ශීලයක් නිසා, මගේ යම්කිසි ගුණ දහමක් නිසයි අන් සියල්ල විනාශ වෙලා යද්දි මම පමණක් මෙසේ ජීවතුන් අතර ඉතිරි වුණේ කියලා වඩ වඩාත් දහම ගැන පැහැදිලා තව තවත් කුසල් දහම් රැස් කළ යුතුයි, තව තවත් සිල් රැකිය යුතුයි, තව තවත් දන් පින්කම් කළ යුතුයි, අන් අයගේ දිවි ගලවා ගත යුතුයි, කියලා වඩාත් දහමට නැඹුරු වුණු බොහෝ අය මේ සමාජයේ ඉන්නවා. ඒ අයට සුනාමිය නිසා මෙලොව පමණක් නෙමෙයි පින්වතුනි සසර ගමනටම මහා භාග්‍යයක් සිදුවෙනවා.

තව සමහර කෙනෙක් කල්පනා කරනවා; අපි දානෙත් දෙනවා, අපි සිල් රකිනවා, අපි පෝයට පන්සලුත් යනවා, අපි මෙච්චර පින්කම් කරනවා, අපි මෙච්චර අභය දානය දීලත් තියෙනවා, ඒ වුණාට මේ ජල කඳට මගේ කියන සියල්ලම අහු වෙලා විනාශ වුණා. එහෙනම් සිල් රැකලා මොකටද? එහෙනම් දානෙ දීලා මොකටද? මේ ධර්මයෙන් ඇති පලක් නැහැ, මේකෙන් අපට වුණු යහපතක් නැහැ, එහෙම යහපතක් වෙනවානම්, දහමෙන් අපි රැකෙනවානම් කෝ රැකුනද? මේ සියල්ලම අපට නැති වුණානෙ, මේ සියල්ලම අපට අහිමි වුණානෙ, දහමෙන් රැකෙනවානම් ඇයි අපි නොරැකුනේ? කසිප්පු කාරයොත් රැකුනා. ඒ වගේම මිනීමරුවොත් රැකුනා. මේ තරම් හොඳින් ගුණ දහම් වඩන අපිට විතරක් ඇයි මේ විපත්ති පැමිණෙන්නේ? එහෙනම් මේ දහමෙන් ඇති ඵලය කුමක්ද? සීලයෙන් ඇති ඵලය කුමක්ද?

මේ කිසිවක හරයක් නැහැ කියලා සීලයෙන් දහමෙන් පිරිහිලා සම්පූර්ණ සසර ගමනම අගාධයට හෙලා ගත්තු මනුෂ්‍යයොත් ඉන්නවා. මුහුද ගොඩ ගැලීම නැමති එකම කාරණය මුල් කරගෙන ඇතැම් කෙනෙක් වැරදි විදියට කල්පනා කරලා මුළු ජීවිතයම අභාග්‍ය සම්පන්න කර ගන්නවා. ඇතැම් කෙනෙක් නිවැරදිව කල්පනා කරලා මුළු ජීවිතයම භාග්‍ය සම්පන්න කර ගන්නවා.

එපිට සහ මෙපිට

මරණය යනු සියල්ල අහිමි වීමක් නොවෙයි පින්වතුනි. අපි බොහෝ වෙලාවට එහි අනෙක් පැත්ත දකින්නෙ නැහැ.මරණය යනු තවත් උපතක්. මෙහි අභාවයට යනවා කියන්නේ ඊලඟ ක්ෂණයේදි තවත් උත්පත්තියක් ලබනවා. උපතක් කියලා කියන්නේ තවත් මරණයක්. මේ කාරණය අපි දකින්නෙ නැහැ. සාමාන්‍ය ලෝකයා දකින්නට පුරුදු වෙලා තියෙන්නේ ඇහැට කණට පේන දැනෙන සාමාන්‍ය කාරණය විතරයි. නමුත් එහි අනෙක් පැත්ත ගැන කවදාවත් අපි හිතන්නේ නැහැ. දරුවෙක් උපදිනකොට අපි කවදාවත් හිතනවද 'මේ දරුවා මට කොයින්ද ලැබුනෙ' කියලා. මව් කුසක දරුවෙක් පහල වෙන්නෙ අනිවාර්යයෙන්ම තවත් තැනක යම් කිසි ජීවිතයක් අභාවයට පත් වෙලාමයි. ඒ විඥ්ඥාණයයි මව් කුසක කලල රූපයක් අල්ලා ගෙන ජීවියෙක් හැටියට ප්‍රතිසන්ධිය ලබන්නේ. එහෙමනම් දරුවෙක් බිහිවෙන්නට නම් තව කොතැනක හෝ යම් සත්වයෙක් යම් මනුෂ්‍යයෙක් අභාවයට යා යුතුයි. එහෙම නම් අපිට දරුවෙක් උපදිනවා කියන්නේ තවත් තැනක අභාවයක්! අපිට කෙනෙක් අහිමි වෙනවා කියන්නේ, තවත් උපතක් සිදු වුණා, ප්‍රතිසන්ධියක් ලෝකයේ කොතැනක හරි සිදු වුණා.

මෙය අමතක කරලා එක් පක්ෂයක් පමණක් දකින නිසා මරණය අභාග්‍යයක් ලෙස දකින්නට අපි පුරුදු වෙලා තියෙනවා. කෙනෙක් මිය පරලොව ගිහිල්ලා ඊලඟ භවයේ ඉපදුනහම - අනේ අපේ පෙර භවයේ ඤාතීන්, අනේ අපේ දරුවන්, එහෙම හිතනවද? පින්වතුනි ඔබ කාටවත් කවරදාකවත් මෙතෙක් හිතිලා තියෙනවද අනේ අපේ පෙර භවයේ දරුවන්ට මොකද දන්නෙ නැහැ වුණේ, අනේ අපේ පෙර භවයේ භාර්යාවට මොකද දන්නෙ නැහැ වුණේ, අපේ මව්පියන්ට මොකද දන්නෙ නැහැ වුණේ, එහෙම කාටවත් කවමදාකවත් හිතිලා තියෙනවද? එහෙම එකක් නැහැ. එතනින් මිය ගියාට පස්සෙ අළුත් ආත්ම භවයක අළුත් මව්පියන් ඇතිව නැවතත් ජනිත වෙනවා. ඒ ජනිත වුණ ආත්ම භවය ජය ගන්නට වෙර වීරිය දරනවා විනා පෙර භවයක් ගැන දුක් වෙවී ඉන්නට ගියොත් එහෙම කවමදාකවත් සුවසේ ලෝකයේ ජීවත් වෙන්නට ලැබෙන්නෙ නැහැ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කළා මෙබඳු කරුණු ගැන අපට නුවණින් සිතා බලන්නට පුළුවන්නම්, කල්පනා කරලා බලන්න පුළුවන්නම්, මරණය නිසා ඇතිවෙන්නාවූ ශෝකය දුක තුනී කරගෙන යථාර්ථය දකින්නට එයම අවස්ථාවක් කර ගන්නට පුළුවන්. ඒ තුළින්ම අපේ ජීවිතයට භාග්‍යය ලඟා කර ගන්න පුළුවන්. කවමදාවත් ජීවිතය ගැන ආවර්ජනා කර බලන්නට යොමු නොවුණු අපි හැමෝටම නැවත වතාවක් අපේ ජීවිතය ගැන ආපහු හැරිලා බලන්න හොඳ අවකාශයක් ලබා ගන්නට පුළුවන්.

ඒ නිසා පින්වතුනි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා හැම කෙනෙකු විසින්ම මේ මරණය නුදුරු අනාගතයේ මා වෙත පැමිණෙන්නට පුළුවන්, තාම මම ජීවත් වෙන කෙනෙක්, ඕනෑම මොහොතක මරණය මා වෙත පැමිණෙන්නට පුළුවන් කියන මේ කාරණය නැවත නැවත සිහි කරන්න කියලා.

පින්වතුනි මේ මරණය සිදුවෙන ආකාරය තථාගතයන් වහන්සේ දේශනා කරනවා ඉතාම සරල ආකාරයට. කොහොමද මරණය සිදු වෙන්නේ? කොහොමද උත්පත්තිය ඇති වෙන්නේ? මරණය සිදු වෙන ආකාරය ගැන තේරුම් ගන්නට නම් කෙනෙක් උපදින්නේ කොහොමද කියලා තේරුම් ගන්නට ඕන.

උපත

කොහොමද කෙනෙක් උපදින්නේ? මව් කුසක වැඩෙන එක්තරා කලල රූපයකට, මේ ලෝකයේ මිය යන්නා වූ තවත් සත්වයෙකුගේ විඥ්ඥාණයක්, - සිතක් ඇවිත් මගේය කියන තෘෂ්ණාවෙන් මේ කලල රූපය, එහෙම නැත්නම් ඒ මවු කුසේ

තියෙන මස් කැටිය සමග තදින් බැඳෙනවා. අන්න ඒ බැඳුණු අවස්ථාව අපි කියනවා දරුවෙක් පිළිසිඳ ගත්තාය කියලා. එහෙම විඤ්ඤාණයක් විසින්, සිතක් විසින් ඒ මස් කැටිය ග්‍රහනය නොකර ගත්තොත් ස්වභාවිකව එය ඉවත් ව යනවා විනා එතන දරු ප්‍රසූතියක් ඇති වන්නේ නැහැ. එහෙමනම් දරුවෙක් පිළිසිඳ ගත්තාය කියලා කියන්නේ කුමක්ද? මවු කුසේ කලල රූපයක් හට ගත්ත පමණින් දරුවෙක් හට ගත්තා කියන්නට බැහැ. ලෝකයේ සැරි සරන්නාවූ යම්කිසි විඤ්ඤාණයක්, ඒ කලල රූපය මමත්වයෙන් ග්‍රහණය කර ගන්නා තැන ප්‍රතිසන්ධියක් ය, දරු උපතක් ය කියලා අපි හඳුන්වනවා.

එතැන් පටන් මවගේ ලෙයින් මසින් දරුවාගේ කය පෝෂණය වෙනවා. අංග ප්‍රත්‍යාංග පිහිටීම මව්පියන්ගේ ශක්තියෙනුත්, ඒ වගේම ඒ පැමිණෙන්නාවූ විඤ්ඤාණයේ කුසල අකුසල කර්ම බලය මතත් සිද්ධ වෙනවා. කුසල අකුසල කර්ම බලය මත එය සිදු වෙනවා කියන්නෙ, ඒ දරුවාගේ ඇහැ පිහිටන්නේ කොහේද, කණ පිහිටන්නේ කොහේද, ඇස් දෙක පේනවද, කන් දෙක ඇහෙනවද, හෘදය වස්තුව හරියට තියෙනවද, ඒකෙ සිදුරක් තියෙනවද, මේවා තීරණය කරන්නේ මවවත් පියාවත් නෙවෙයි. ඒ පැමිණෙන්නාවූ විඤ්ඤාණයේ කුසල අකුසල කර්ම ඵලය මතයි. ජානවල සිදුවන යම් යම් වෙනස්කම් නිසා එසේ වනබව වෛද්‍යවරු කියනවා. නමුත් ඒ ජාන විකෘතියට පුද්ගලයා සතු කර්ම බලය විශේෂයෙන්ම හේතු වෙනවා. මෙසේ මවුපියන්ගේ ශක්තියෙනුත්, පැමිණෙන්නාවූ විඤ්ඤාණයේ කුසල අකුසල කර්ම බලයෙනුත්, කියන මේ දෙපාර්ශ්වයේම සහාය ඇතිවයි ඒ කය පරිපූර්ණ මිනිස් කයක් ලෙස පෝෂණය වෙන්නෙ. පූර්ණ වයස් සීමාව ඉක්මෙද්දි මව්කුසින් බිහි වෙලා මේ ලෝකයට ජනිත වෙනවා. එසේ ජනිත වෙද්දි මෙතෙක් කාලයක් මවගේ කුස තුළ පෝෂණය වුණු ඒ දරුවා බාහිර වායුගෝලයට විවෘත වෙද්දි මහා කම්පනයක් ඇති වෙනවා. ඒ නිසා තමයි හඬන්නේ. ඒ හැඬීමත්, කම්පනයත් එක්කලා හෘදය වස්තුව සහ පෙනහළු ක්‍රියාත්මක වෙලා, පළවෙනි වතාවට ස්ව උත්සාහයෙන් නාසයෙන් හෝ කටින් හුස්ම ඇතුළට ඇද ගන්නවා.

සුළං රැල්ලක රැඳුණු ජීවිතය

ඒ නිසා මේ මුළු ජීවිතයම පවත්වන්නාවූ පළවෙනි කාරණය හැටියට තථාගතයන් වහන්සේ දේශනා කරනවා ආශ්වාස ප්‍රශ්වාස. මේ සත්වයාගේ ආයු කාලය ඉතා කෙටි කාලයක්. මේ ආයුෂය රඳා පවතින්නේ මොකක් මතද, ආශ්වාස ප්‍රශ්වාස වායුව මතයි. ඇයි ආශ්වාස ප්‍රශ්වාසය මතයි රඳාපවතින්නේ කියලා කියන්නේ? මේ ශරීරය සහ විඤ්ඤාණය එකට බද්ධ කොට පවත්වන්නට ප්‍රාණ වායුව කියලා එක්තරා උණුසුම් වායු කදම්බයක් මේ ශරීරය තුළ ක්‍රියාත්මක වෙනවා. ඒ වායු කදම්බය නිසා තමයි මේ විඤ්ඤාණය මේ කයට බද්ධව පවත්වන්නට පුළුවන් වෙන්නෙ. ඒ ප්‍රාණ වායුව විසිරෙන්නේ නැතිව, ඉවත් වෙන්නේ නැතිව රඳා පවත්වන්නෙ කුමක් විසින්ද? මේ අප නාසයෙන් කටින් ඇද ගන්නාවූ ආශ්වාස ප්‍රශ්වාස වායුව, එහෙම නැත්නම් අම්ලකර වායුව විසින්. එහෙම නම් පින්වතුනි ඒ අම්ලකර වායුව නොලැබුනොත් ප්‍රාණ වායුව විසිරී යනවා. ප්‍රාණ වායුව විසිරී ගියොත් විඤ්ඤාණය මේ කය අතහැරලා තවත් ප්‍රතිසන්ධියක් ලබනවා. දැන් එහෙම නම් අපේ මුළු ජීවිතයම රඳා පවතින්නේ කුමක් මතද, වායු රැල්ලක් නැමැති අතිශයින් දුර්වල වූ කාරණයක් මතයි. මේ සියළු සත්වයන්ගේ ජීවය රඳා පවතින්නේ ඒ මතයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ''ආයුනාමෙතං අබලං දුබ්බලං" සත්වයාගේ ආයුෂය වනාහි අතිශයින්ම දුබලයි. ආයුෂය කියන්නේ මොකක්ද පින්වතුනි? උත්පත්තියේ පටන් මරණය දක්වා මේ කය පවතින කාල වකවානුවට කියනවා ආයුෂය කියලා. සිතේ ආයුෂ නෙවෙයි. සිතේ ආයුෂ නම් චිත්තක්ෂණයයි. කයේ ආයුෂය ගැනයි අපි මේ කථා කරන්නේ. උපතේ සිට මේ විඤ්ඤාණය ඉවත්ව යන තෙක් පවතින්නාවූ කාල වකවානුවට තමයි අපි ආයු කාලයයි කියලා කියන්නේ. මේ පවතින්නාවූ ආයු කාලය විනිශ්චය වන්නේ මොකක් මතද? ප්‍රාණවායුව මේ කය තුළ පවතින තාක් කල්. ප්‍රාණවායුව රඳා පවතින්නේ ආශ්වාසය මත. ඒ නිසා බුදුහාමුදුරුවෝ දේශනා කරනවා ආශ්වාස ප්‍රශ්වාසය මතයි කෙනෙකුගේ ජීවය රඳා පවතින්නේ. මේ කතා කරන මම එළියට දැමූ හුස්ම ටික ඇතුලට ඇද ගන්නට බැරි වුණොත් මොකද වෙන්නේ? මෙතනම මිය ඇදෙනවා. ඇතුලට ගත් හුස්ම ටික එළියට පිට කර ගන්න බැරි වුණොත් මොකද වෙන්නේ, ඒත්

මිය ඇදෙනවා. මේ තරම් සරල සිදුවීමකින් පවා අපේ ජීවිත අහෝසි වෙන්නට පුළුවන් මොකක් නිසාද? මේ වායුව මත ජීවය පවතින නිසයි.

කලක් ජීවත් වීම පුදුමයි !

ඒ නිසා රේරුකානේ චන්දවිමල මහා නායක හාමුදුරුවෝ නිතර නිතර කියන කාරණයක් තමයි, -මට නම් පුදුම හිතෙන්නේ මේ මිනිස්සු මැරෙනවයි කියන එක ගැන නෙමෙයි, කොහොමද මේ තරම් කාලයක් මේ මිනිස්සු ජීවත් වෙන්නේ කියලයි." ඇයි එහෙම හිතන්නේ, මේ ජීවිතයේ පවතින්නාවූ ඇත්ත තත්‍වය හරියට හඳුනා ගත්තොත් ඇත්තටම මැරෙණ එක ගැන නෙවෙයි පින්වතුනි පුදුම විය යුත්තේ, මේ අවුරුදු අසූවක් අනූවක් තැලෙමින් පොඩිවෙමින් මේ වායු රැල්ල විසිරෙන්නේ නැතිව මේ කය ඇතුලේ පැවතීම ගැනයි.

ඒ නිසා උන් වහන්සේ උපමාවක් සඳහන් කරනවා, හරියට මේ ජීවිතය; මහා පිට්ටනියක් මැද්දේ නිරාවරණව දල්වා ඇති පහනක් වගේ කියලා. ඒ පහන දස දික් භාගයෙන් පැමිණෙන්නාවූ ඕනෑම සුළං රැල්ලකින් නිවී යන්නට පුළුවන්. එහෙම නොනිවී දැල්වෙනවා නම් එයයි පුදුමය. නිවෙනවා කියන එක නෙමෙයි. අකාශයෙන් වැටෙන ජල බිඳකින් මෙය නිවී යන්නට පුළුවන්, පළඟැටියෙක් සමනළයෙක් ඇවිදින් වැදීමෙන් මෙය නිවී යන්නට පුළුවන්, කොළයක් අත්තක් රිකිල්ලක් වැටීමෙන් මෙය නිවී යන්නට පුළුවන්, කෙනෙකුගේ පය පැකිළීමෙන් මෙය නිවී යන්නට පුළුවන්, තෙල් ඉවර වීමෙන් තිරය ඉවර වීමෙන් මෙය නිවී යන්නට පුළුවන්. නිවී යන්නට දහසකුත් කරුණු තිබියදී මේ පහන නොනිවී දැල්වෙනවා නම්, එයයි ඇත්තටම ආශ්චර්ය කාරණය. අන්න ඒ වගේ මේ වායු රැල්ලක් මත පවතින්නාවූ මේ ජීවය ඇත්තටම අවුරුදු අසූවක් අනූවක් ජීවත් වෙනවා නම්, එයයි ආශ්චර්ය, හදිසියේ මෙය ඇද වැටෙනවා කියන එක නෙමෙයි කියලා උන් වහන්සේ නිතර සිහිපත් කළා. ඒ නිසා උන් වහන්සේ නිතර කියපු කාරණයක් තමයි මේ තරම් මිනිස්සු මිය යද්දී මම ඇයිද මිය යන්නේ නැත්තේ කියලා. මේ තරම් දුබල වෙලත්, මේ තරම් වයෝවෘධ වෙලත් ඇයි මම මිය යන්නේ නැත්තේ. එහෙම

හිතන්නට උන් වහන්සේට පුළුවන් වුනේ, ජීවිතයේ යථාර්ථය උන් වහන්සේ හඳුනාගෙන තිබුණු නිසයි.

ඒ නිසා පින්වතුනි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අපි හැම කෙනෙකුගේම ආයු කාලය - ජීව කාලය මහා ශක්ති සම්පන්නය, අපට මේ මේ දේ කරන්නට පුළුවන්ය, ගහන්නට මරන්නට කොටන්නට දුවන්නට පනින්නට මේ හැම දෙයක්ම අපට කරන්න පුළුවන් කියලා අපි හිතාගෙන හිටියත්, මේ සියළු හැකියාවන් සියළු කෙරුම්කාරකම් රඳා පවතින්නේ කුමක් මතද? ඕනෑම මොහොතක විසිරී යන්නට පුළුවන් වායු රැල්ලක් මතයි. අද කාලයේ හැටියට කියනවානම් මදුරුවෙකුටත් පුළුවන් අපේ ජීවිතය අහවර කරන්න. ඒ නිසානේ ඩෙංගු මාරාන්තිකයි කියලා කියන්නේ. මේ මෑත භාගයේ මතුවුණ මාස ගණනාවක් වසර ගණනාවක් දුක් විඳින්නට තරම් හේතු වෙන නොයෙක් උණ රෝග ආදිය කාගෙන්ද බෝ වෙලා ජීවිතය විනාශ වෙන්නේ? මදුරුවෙක් වැනි කුඩා සතෙකුටත් පුළුවන් අපේ ජීවිතය විනාශ කරන්න. ඒ තරම් දුබල ජීවිතයක් තමයි අපි හැම දෙනාම මේ ආකාරයෙන් පවත්වන්නේ.

නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ එහෙම හිතලා දුක් වෙලා කම්පා වෙලා, අනේ ඉතින් දුබල ජීවිතයක් නේද ගත කරන්නේ කියලා තැවි තැවී ඉන්නට නෙවෙයි. මේ පවතවන්නාවූ ජීවිතයෙන් උපරිම ප්‍රයෝජන ගන්නට නම් මේ සත්‍යය හඳුනා ගෙන සිටිය යුතුයි.

කය නැමති යානය

දෙවෙනි කාරණයක් තථාගතයන් වහන්සේ දේශනා කරනවා, මේ ජීවිතය පවතින්නේ ශීත උෂ්ණ දෙක මතයි. මේ කයේ ප්‍රාණ වායුව පවතින්නට උපකාර වන එක්තරා උණුසුමක් තියෙනවා. ඒ උණුසුම අඩුවුණත් එතන ජීවය පවතින්නේ නැහැ. වැඩි වුණත් එතන ජීවය පවතින්නේ නැහැ. අපේ රටේ දකින්න නැති වුණාට ඉන්දියාව වගේ රටවල අපට නිතර අහන්න දකින්න ලැබෙනවා, ඔන්න උෂ්ණත්වය වැඩි වෙලා මෙපමණ මිනිස්සු මැරුණා, ඔන්න සීතල වැඩි වෙලා මෙපමණ මිනිස්සු මැරුණා.

ඇයි මේ? ශීත උෂ්ණ දෙක අඩු වැඩි වුණාම එතන රෝගයක් හට ගන්නවා, සීමාව ඉක්මවා උත්සන්න වුණු සැනින් ජීවය අහවර වෙනවා. එහෙමනම් මේ කයේ ආයු කාලය රඳා පවතින්නේ ශීත උෂ්ණ දෙක සමසේ තිබුණොත් පමණයි.

ඊලඟට බුදුහාමුදුරුවෝ තුන්වෙනි කාරණයක් දේශනා කරනවා, ''ඉරියාපථූපනිබද්දඤ්ච'' මේ කයේ ඉන්ද්‍රිය එහාට මෙහාට හොලවලා ක්‍රියාත්මක කරන තාක් පමණයි ආයුෂය පවතින්නේ. යම් මොහොතක මේ කය ක්‍රියාත්මක කරන්නට බැරි වුණොත්, අන්න එතනදි මේ ජීවය අහවර වෙනවා. මේ කය, හෘදය වස්තුව හා මොළය උදව් කරගෙනයි ක්‍රියාත්මක වන්නෙ. හෘදය වස්තුව නිසා ලේ ගමනාගමනය වීම ප්‍රාණවායුව රඳා පවතින්නට පහසුවක් ඇති කරනවා. මොළය නිසා මේ කය නඩත්තු කරන්නට, ක්‍රියාත්මක කරන්නට යම්කිසි පහසුවක් ඇති වෙනවා. මොළය හා හෘදය වස්තුව යන මේ දෙකින් කොතනකට හරි අනතුරක් සිදු වුණොත් එතනින් එහාට මේ ජීවය පවත්වන්න බැහැ.

දැන් මේ මහත්මයාට ඒ විදියට හදිසියේ ඇතිවුණු හෘද රෝගයක් නිසා මේ කය අත හරින්නට සිදු වුණා. ඇයි? හෘදය අක්‍රිය වුණානම්, මොළය අක්‍රිය වුණානම් එතනින් පස්සේ මේ විඤ්ඤාණයට කය ඇසුරු කරගෙන පවතින්න බැහැ. මේ කය නඩත්තු වෙන්නේ ඒ තුළින්. අපි වාහනයක් ගත්තොත් එහි තෙල් නිවැරදිව වැඩ කරන තෙක්, ඒ වගේම එන්ජිම නිවැරදිව ක්‍රියාත්මක වෙන තෙක් ඒ වාහනය නිසි සේ හසුරුවන්න පුළුවන්. නිවැරදිව තෙල් වැඩ කරන්නේ නැතිනම්, නිවැරදිව එන්ජින් එක ක්‍රියාත්මක වෙන්නේ නැතිනම්, ඒ වාහනය නිසි සේ හසුරුවන්න බැහැ. මේ කයත් හරියට වාහනයක් වගේ. මේ කයේ ලේ ගමනාගමනය නිවැරදිව සිද්ධ වෙනතාක් කල්, මොළය විසින් මේ කය නිවැරදිව පාලනය කරන තාක් කල්, මේ කය නඩත්තු කරන්න පුළුවන්. ඒ දෙකට යම් අනතුරක් වුණොත් විඤ්ඤාණයට මේ කය ඇසුරු කර ගෙන තව දුරටත් පවතින්න පුළුවන් කමක් නැහැ. ඉන් අනතුරුව විඤ්ඤාණය මේ කය අත හරිනවා. එසැනින්ම කුසලාකුසල කර්ම බලය මත තවත් තැනක ප්‍රතිසන්ධිය ලබනවා. වාහනයක නම් අළුතෙන් එන්ජිමක් තියලා ප්‍රතිසංස්කරණය කරන්න පුළුවන්. කයේ ප්‍රධාන ඉන්ද්‍රිය අක්‍රිය වුණොත් ප්‍රතිසංස්කරණය කරන්න කාලයක් නැහැ, සැනෙකින් විඤ්ඤණය නිරුද්ධව තව තැනක

ජනිත වෙනවා.

ඊලඟට බුදුරජාණන් වහන්සේ හතර වැනි කාරණයකුත් දේශනා කරනවා, ''ආහාරූපනිබද්දඤ්ච'' මේ කය රඳා පවතින්නේ ආහාරය නිසයි. කැබලි වශයෙන් ගන්නා ආහාරය හෝ දියර වශයෙන් ගන්නා ආහාරය හෝ ආශ්වාස ප්‍රශ්වාස වශයෙන් හෝ ආහාර ගන්නා තාක් කල්, මේ කය රඳා පවතිනවා. ආහාර ගන්න බැරි වුණොත් මේ කය එතැනින් එහාට පවතින්නේ නැහැ.

එහෙනම් බුදුහාමුදුරුවෝ දේශනා කරනවා මේ ශරීරය නඩත්තු කරන්න අපිට පුළුවන් වෙන්නේ මෙන්න මේ කරුණු හතර මතයි. මොනවද ඒ කරුණු හතර; ආශ්වාස ප්‍රශ්වාස, ශීත උෂ්ණ, ඉරියව් පැවැත්ම, ආහාර කියන මේ කරුණු හතර මත කෙනෙකුගේ ජීවය රඳා පවතිනවා. මේ කරුණු හතරෙන් එකක් හෝ වෙනස් වුණොත්, එක්කො ආශ්වාස ප්‍රශ්වාසය අවහිර වුණොත්, එහෙම නැත්නම් ආහාර නොලැබුනොත්, එහෙමත් නැත්නම් ඉරියව් පැවැත්ම අක්‍රිය වුණොත්, එහෙමත් නැත්නම් ශීත උෂ්ණ අඩු වැඩි වුණොත් එතනදී කය අතහරින්නට අනිවාර්යයෙන්ම සිදු වෙනවා. මේක ස්වාභාවිකව සිදු වෙන්නටත් පුළුවන්. එහෙමත් නැත්නම් අස්වාභාවිකව සිදු වෙන්නටත් පුළුවන්. රෝගයක් නිසා වෙන්නටත් පුළුවන්, වයස්ගත වීම නිසා වෙන්නටත් පුළුවන්. කොහොම සිදු වුණත් මූලධර්මය එකමයි.

මගේ මේ ජීවිතයේ ස්වාමීන් වහන්සේලා දෙනමක් ස්වභාවිකව මිය යන ආකාරය දකින්නට අවස්ථාව ලැබුණා. මම හිතනවා එය මගේ ජීවිතයේ එක්තරා භාග්‍යයක් කියලා. ඇයි එහෙම හිතන්නේ? උන්වහන්සේලා ක්‍රමාණුකූලව අපවත් වුණා. එය දැකීම නිසා ජීවිතය ගැන ලෝකය ගැන මරණය ගැන යමක් අවබෝධ කර ගැනීමට අපට අවකාශ ලැබුණා.

මරණය අබියස නොසැළුණු උතුමන්

රේරුකානේ චන්දවිමල මහා නායක හාමුදුරුවෝ අපවත් වුණු ආකාරය අපට දෙනෙතින් දකින්නට අවකාශ ලැබුණා. උන්වහන්සේ එදා උදෑසන හුස්ම ගැනීම තරමක් අපහසුයි කියලා අපට කථා කරලා කිව්වා, ''මෙන්න මේක තමයි පණ අදිනවා කියන්නේ කියලා

අපි මොකටද පණ අදිනවා කියලා කියන්නේ? මේ ශරීරය පුරා විසිරී පවතින ප්‍රාණ වායුව ඒකරාශී වෙලා එක තැනකින් ඉවත් වෙනවා. කයේ කොතනකින් හරි පිට වෙනවා. ඒ කයේ ප්‍රාණ වායුව නිරුද්ධ වෙන්නට කලින් ඒ ප්‍රාණවායුව එක් තැනකට ඒකරාශී කිරීම තමයි අපි පණ අදිනවා කියන්නේ. රේරුකානේ නායක හාමුරුවෝ උදෑසන පටන් රාත්‍රී 8.55 වෙනකම් සම්පූර්ණයෙන් පැය දොළහක් පමණ කාලයක් මුළුල්ලේ ක්‍රමානුකූලව දුර්වල වෙලා තමයි, උන් වහන්සේගේ අවසන් හුස්ම හෙළුවෙ. උදේ උන් වහන්සේ කතා කරමින් හිටියා. ටිකෙන් ටික ඒ කතාව නැවතුනා. ඊලඟට ටිකෙන් ටික අතපය සෙලවීම නැවතුනා. ඊලඟට වට පිට බලන එක නැවතුනා. කතා කරන්නට හදනවා, බලන්නට උත්සාහ කරනවා, නමුත් ක්‍රියාත්මක කරන්න බැහැ. අතපය සොලවන්නට හදනවා, නමුත් සොලවන්න බෑ. තවත් ටිකෙන් ටික කාලය ගත වෙන කොට අතපය ටිකෙන් ටික සීතල වීගෙන යනවා. එහෙම සීතල වෙලා අවසාන අවස්ථාව වෙනකොට, අතිශය වෙහෙසකර ආකාරයෙන් තමයි හුස්ම ඇතුලට ඇද ගන්නෙ. ඇයි එහෙම වෙන්නේ?

වෛද්‍යවරු සඳහන් කරනවා, ක්‍රමානුකූලව මිය යන කෙනෙකුගේ පෙනහළු වල වායුව එකතු වෙන කුහර සෙම වලින් පිරීම නිසා වායුව ඇදගන්නට අපහසුතාවයක් ඇති වෙනවා. ඒ නිසා හුස්ම ඇතුලට ඇද ගන්නටත් වෙහෙසක් දරන්න ඕනෑ. ඇතුලට ඇදගත් හුස්ම පිට කරන්නටත් මහත් වෙහෙසක් දරන්න ඕනෑ. සමහර අවස්ථාවලදි උන්වහන්සේට විනාඩි දෙක තුනක් යනවා එක වරක් හුස්ම ඇදලා පිට කරන්න. මෙසේ සෑහෙන වෙලාවක් මේ වෙහෙසකර කාර්යයේ නිරත වෙද්දී එක් සැනෙකින් මුළු ගතම එකවර සලිත වෙලා උගුරේ පැටලිලා තිබුණු සෙම ගුලියක් ගැලවිලා පිටට ආවා, ආපහු එය ඇතුලට ගියා. එපමණයි. ඒ අවසන් හුස්ම හෙලීමයි.

සැබෑ විපත!

ඊලඟට තව අපේ පන්සලේ හාමුදුරු නමක් ක්‍රමානුකූලව අවසන් හුස්ම හෙළු හැටි අපි දුටුවා. ඉතින් මෙබඳු අවස්ථා දකින කොට තමයි අපිට වැටහෙන්නේ ඇත්තටම මේ ජීවත් වෙනවාය කියන එක, මරණය කියන එක කෙබඳු දෙයක්ද? ඒ මරණය කියන අවස්ථාව සැබැවින්ම තැති ගත යුතු දෙයක්ද? බියපත්

වියයුතු දෙයක්ද? එය හොඳින් අධ්‍යයනය කළ යුතු දෙයක්ද? කියලා තේරුම් ගත්තොත් අපට මේ ජීවිතය ඉතාම වැඩදායක ආකාරයට සකසා ගන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ මේ මරණය ගැන නැවත නැවත හිතන්නට කිව්වෙ, පින්වතුනි අපි කැමති වුණත් අකමැති වුණත් අපි හැම කෙනෙක්ම කවදා හෝ මරණයට අනිවාර්යයෙන් පත් වෙනවා. ඒක නවත්වන්නට බැහැ. අනන්ත සසරේදී අපට ඒ සිද්ධිය සිද්ධ වුණා. එය අමුතු විපතක් නොවෙයි. මේ ජීවිතයෙත් එය කවදා හරි සිද්ධ වෙනවා නම් නමුත් එයට මුහුණ පාද්දි බියපත් වෙනවා නම් තැති ගන්නවා, වික්ෂිප්ත වෙනවා නම් එය අකුසලයක්. අප මෙලොවට හෝ පරලොවට හෝ බරපතලම හානිය වෙන්නේ අපේ කය අභාවයට යාමෙන් නොවෙයි. අකුශලයෙන් සිත කිලිටිවීමෙනුයි. කය අහිම වූ සැනින් කයක් ලබනවා. නමුත් සිත කිලිටි වීම දීර්ඝකාලයක් දුක පිණිස හේතු වෙනවා.

අපි බොහෝ දෙනෙක් අකුසල පාප ධර්ම යැයි කියන්නෙ ලෝක සම්මත දේට පමණයි. සමහර මිනිස්සු කියනවා අපි කාටවත් නපුරක් කරන්නේ නැහැ. අපි කාටවත් හිංසාවක් කරන්නේ නැහැ කියලා. ඒ අය හිතාගෙන ඉන්නේ අනුන්ට හිංසා කිරීම විතරයි අකුසලය කියලා. අනුන්ට අවැඩක් කිරීම විතරයි අකුසලය කියලා. අකුසලය කියන්නේ පින්වතුනි අනුන්ට හිංසා කිරීමවත්, අනුන්ට අවැඩ කිරීමවත්, පමණක් නෙමෙයි, තමන්ගේ මනස කිළිටි වෙනවානම්, තමන්ගේ මනසේ ශක්තිය හීන වෙනවානම්, තමන්ගේ මනස දුර්වල වෙනවානම්, ඒකට තමයි අකුසලයයි කියන්නේ. භීතිය නිසා, ද්වේශය නිසා, වෛරය නිසා, තැති ගැන්ම නිසා, ඊර්ෂ්‍යාව නිසා, ක්‍රෝධය නිසා, මේ සෑම දෙයක් නිසාම අපේ මනසේ ශක්තිය හීන වෙනවා. පසු තැවීම නිසා, හඬා වැළපීම නිසා, දුක දොම්නස නිසා, අපේ මනසේ ශක්තිය හීන වෙනවා. එහෙනම් හඬා වැළපීම යනු අකුසලයයි. බියට පත්වීම යනු අකුසලයයි. තැති ගැන්ම යනුත් ඒ වගේම පසු තැවීම යනුත් බිය පත්වීම යනුත් අකුසලයයි. මේ හැම දෙයක්ම අකුසල පාප ධර්මයන්. එතැන අකුසලයයි කියන්නෙ අනුන්ට හිංසා කිරීම නෙවෙයි. අපේ මනසේ ශක්තිය පිරිහීමයි. මනසේ ශක්තිය පිරිහීම නිසා මතු භවයේ දුගතිගාමී වෙනවා. මිය යන මොහොතේ අපේ මානසික ශක්තිය පිරිහුනොත් දුගතිගාමී වෙන්න

ඉඩකඩ වැඩියි.

සිත කෙළෙසුණොත්

පින්වතුන් අහලා ඇති ධර්මාශෝක රජු අසූ හාර දහසක් වෙහෙර විහාර හැදුවා. ඒ වගේම තමන්ගේ දරුවෝ දෙන්නා සසුන් ගත කරලා උන්වහන්සේලා රහතන් වහන්සේලා බවට පත් වුණා. ඒ වගේම මේ ලෝකේ බොහෝ රට වල ධර්ම ප්‍රචාරය කළා. මේ තරම් මහා කුසල ධර්ම රැස් කළා වූ රජ්ජුරුවෝ මිය යන මොහොතේ මොකද වුණේ? අර පින්කම් ගැන නෙමෙයි මනස පැවතුනේ. අන් අය පවන් සලනවා කියලා, ඒකට හිත නරක් කර ගත්තා. දැන් ඒ හිත නරක් කර ගත්ත එකෙන් කාටවත් අවැඩක් නැහැ, කවුරුවත් ඒක දන්නෙවත් නැහැ. නමුත් තමන්ගේ මානසික ශක්තිය පිරිහුනා. පිරිහුන මනසින් අභාවයට ගියා. කොහෙද උපන්නෙ? පිඹුරෙක් වෙලා උපන්නා. තිරිසන් ආත්මෙ උපදින්නට කරපු පාප කර්මය, අකුසල කර්මය වුනේ මොකක්ද? හිත නරක් කර ගැනීම. හිත දූෂ්‍ය කර ගැනීම. මානසික ශක්තිය පිරිහීම. එයයි අකුසලයයි කියලා කියන්නේ.

ඒ නිසා අනුන්ට අවැඩක් කළත් නොකළත්, අනුන්ට හානියක් වුණත් නොවුණත්, හොඳක් වුණත් නරකක් වුණත්, ඇත්තක් වුණත් නැත්තක් වුණත්, භාග්‍යයක් වුණත් අභාග්‍යයක් වුණත්, එය පදනම් කරගෙන අපේ මනස පිරිහෙනවා නම්, අපේ මනස දුබල වෙනවා නම්, අපේ මනස අඳුරු වෙනවා නම්, අපේ මනස කිළිටි වෙනවා නම් මොනම කාරණයක් පදනම් කරගෙන හෝ, එය තුළින් අපි සිද්ධ කර ගන්නේ අකුසලයක්මයි. එයින් ජීවිතයට යහපතක් වෙන්නේ නැහැ. ඉන් මේ ජීවිතය පිරිහෙනවා. මතු සසර ගමන පිරිහෙනවා. ඒ නිසා තථාගතයන් වහන්සේ දේශනා කළා මරණය ගැන කල්පනා කරද්දී, මරණය ගැන සිතද්දී, අපේ මනස පිරිහෙනවානම්, අපේ මනස දුබල වෙනවානම්, ඒ තැනැත්තාට එයින් සිදු වෙන්නේ, අභාග්‍යයක්මයි. දැන් මම මරණයට පත්වෙන්න ආසන්න වෙනවා කියලා කල්පනා කරද්දී එයින් තැති ගන්නවා නම්, ඒ තැනැත්තාට සිද්ධ වෙන්නේ හානියක්.

මා මුලින් සඳහන් කළානේ මරණය පිළිබඳ මගේ මනසට තදින් දැනුන අවස්ථා කිහිපයක් තියෙනවා කියලා. එයින් එක්

අවස්ථාවක් තමයි, හදිසි වෙඩි හඬක් ඇසෙද්දි, මේ දැන් නොවැරදීම ඒ වෙඩිල්ලක් මට වැදිලා, මම මෙතනම මිය යාවි කියලා සැනෙකින් මහා තැති ගැන්මක් ඇති වුණා. ඇත්තටම මරණ බිය කියන එක මගේ ජීවිතේ පළමු වතාවට ඒ අවස්ථාවෙ මට ඇති වුණා. ඒ අවස්ථාවේදී ඇති වුණු කම්පනය තැති ගැන්ම කොතෙක්ද කියනවා නම්, ඒක ජීවිතේ කවදාවත් වෙන කිසිම සිදුවීමක් නිසා ඇතිවෙන්නේ නැහැ. ඒ සිද්ධිය නිසා මම හොඳ අත්දැකීමක් ලැබුවා.

කය පමණක් මරුට දෙන්න

ඇත්තටම මැරෙන මොහොතකදි මට එහෙම වුණොත් මොකක් වෙයිද? මතු භවයම දුඃඛිත වෙන්න පුළුවන්. මෙන්න මේ අවාසනාවයි බොහෝ මනුෂ්‍යයින්ට සිද්ධ වෙන්නේ. මරණය සිදුවෙන මොහොතේ ඇතිවන තැති ගැනීම නිසා, ඒ තැති ගත් මනසින් මිය යනවා කියන්නෙ දුගතිගාමී වෙන්න පසුබිම සකසා ගැනීමක්.

ඒ නිසයි බුදුරජාණන් වහන්සේ මෙබඳු උපමාවක් දේශනා කළේ; උන් වහන්සේ පස් පිඩක් නිය පිටට අරගෙන භික්ෂූන් වහන්සේලාගෙන් අහනවා මහණෙනි, මහපොළොව මතු පිට තියෙන පස්ද වැඩි, මේ නිය පිට තියෙන පස්ද වැඩි? ස්වාමීනි බුදුරජාණන් වහන්ස, ඒකට උපමාවක්වත් කියන්න වැටහෙන්නෙ නැහැ. ඒ තරම් අල්පයක් ඔබ වහන්සේගේ නිය පිට තියෙන පස්. ස්වාමීනි මේ මහ පොළොවේ තියෙන පස් අනන්තයි අප්‍රමාණයි. බුදු හාමුදුරුවෝ දේශනා කරනවා, මහණෙනි, අන්න ඒ වගේ තමයි මේ මනුෂ්‍ය ලෝකේ ජීවත් වෙන මිනිසුන් අතරින් නැවතත් මනුලොවට, සුගතියකට එන්නට පුළුවන් කෙනෙක් ඉන්නවා නම් මේ නිය පිටට ගත් පස් හා සමානයි. ඉතා අල්පයයි. දුගතිගාමී වන සත්වයෝ අප්‍රමාණයි.

ඇයි මෙහෙම වෙන්නේ? ජීවිතය කියන්නේ මොකක්ද, මරණය කියන්නේ මොකක්ද කියලා අනවබෝධය නිසා. ඒ අනවබෝධය නිසා තැති ගන්නවා, බියපත් වෙනවා. අනවබෝධය නිසා දුක් දොම්නස් ඇති කර ගන්නවා. ඒ තුළින් අපි මානසික පරිහානියක් ඇති කර ගන්නවා. පිරිහුනාවූ මනස සුගතියක් පිළිබඳ

යහපත් අරමුණක් ගන්න තරම් ශක්තිමත් නැහැ. එය ඉතා දුබල වූ අරමුණක් ගනිමින් පහත් තත්ත්වයක ප්‍රතිසන්ධියක් ඇති කරනවා. ඒ නිසයි අකුසලය දුගතිගාමී වෙන්නට හේතුවක් වෙනවා කියන්නෙ. එබඳු අය විනාශ වෙන කයත් සමග සිතත් විනාශ කර ගන්නවා. සසර ගමනත් විනාශ කර ගන්නවා.

සිත රකින්න පුරුදු වෙන්න

පසු තැවීම කියන්නෙත් එබඳුම දෙයක්. දුක්වීම කියන්නෙත් එබඳුම දෙයක්. ඒ නිසා පින්වතුනි අපි උත්සාහවත් වෙන්නට ඕනෑ අපේ මනස දුකින් දොම්නසින් හැමවිටම නගා සිටුවා ගන්නට. අපේ මනස පරිහානියට පත්වීමෙන් හැම විටම නගා හිටුවා ගන්නට අපි උත්සාහ ගන්නට ඕනෑ. කාරණය හොඳක් වුණත් නරකක් වුණත් එය නෙමෙයි වටින්නේ. මේ මනස තියෙන්නෙ කොතනද කියන එකයි වැදගත් වෙන්නෙ. හොඳ දෙයක් පදනම් කරගෙන වුණත් කෙනෙකුට හිත නරක් කර ගන්න පුළුවන්. කොසොල් රජ්ජුරුවෝ දීපු අසදෘෂ දානය පදනම් කරගෙනත් එක් අමාත්‍ය වරයෙක් හිත නරක් කර ගත්තා. ඒ හිත නරක් කර ගැනීමේ අකුසලය දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් ඔහුට ඒ භවයේදීම විපාක දුන්නා. මෙහෙම අපට හොඳ දේවල් පදනම් කර ගෙනත් අකුසල් කර ගන්න පුළුවන්. හොඳ දේවල් පදනම් කර ගෙන කුසල් කර ගන්නටත් පුළුවන්. නරක දේවල් පදනම් කර ගෙන අකුසල් කර ගන්නටත් පුළුවන්. නරක දේ, නරක බව වටහාගෙන, ඒ දිහා නිවැරදිව දැකලා අවබෝධ කරගෙන ප්‍රඥාවෙන් කුසලයට යොමු වෙන්නටත් පුළුවන්.

ඒ නිසා කෙනෙකුගේ අභාවය යනු හැමදාම දුක දොම්නස ඇති කර ගන්නට කරුණක් නෙමෙයි. නිවැරදිව අවබෝධ කර ගන්නට, ජීවිතය ගැන වටහා ගෙන ශක්තිමත් මනසින් නැගී සිටින්නට, ජීවිතයට මුහුණ දෙන්නට, යථාර්ථය දකින්නට, ජීවිතයේ භාග්‍යය උදා කර ගන්නට, හොඳම කාරණයක් වෙනවා. ඒ නිසයි බුදුරජාණන් වහන්සේ නැවත නැවතත් මරණය ගැන සිතන්නට කියලා දේශනා කළේ. අපි මරණය ගැන කල්පනා කරලා, මෙසේ අවබෝධ කරගෙන නොතිබුණොත් මොකද වෙන්නෙ? මිය යන මොහොතේ අපිටත් ඇති වන්නේ තැති

ගැන්මක්. අවබෝධයෙන් කරුණු තේරුම් අරගෙන සිත සකසා ගන්න අපහසුනම්, අඩුම තරමින් තමන් කළ පිංකමක් සිහි කරගෙන ඒ තුළ මනස පවත්වා ගන්නට වත් උත්සාහවත් විය යුතුයි. නමුත් ඒකත් පහසුවෙන් කරන්න නම් ජීවත් වෙලා ඉන්න කාලය තුළ පිනට දහමට මනස හුරු කරලා තිබිය යුතුයි.

පෙරහුරුව වැදගත්

ගුරුවරයෙක් දරුවන්ට උගන්වනකොට කොතරම් ඉගැන්වුවත්, විභාගයට පෙනී සිටින්නට පෙර, සමාන ප්‍රශ්න නැවත නැවත ඉදිරිපත් කරලා, ඒ දරුවන්ගේ මනස හසුරුවන්නට හුරු කරන්න ඕනෑ. වාර පරීක්ෂණ අර්ධ වාර පරීක්ෂණ වාර්ෂික පරීක්ෂණ වශයෙන් නැවත නැවත ප්‍රශ්න පත්තර වලට ලියන්නට සලස්වන්නේ කුමක් නිසාද? දැනුම තිබූ පමණින් විභාගය සමත් වෙන්න බැහැ. ඒ හා සමාන ප්‍රශ්න වලට මුහුණ දීලා මනස පුරුදු කරන්නට ඕනෑ, එබඳු තත්වයකදී තැති ගන්නේ නැතිව කොහොමද පිළිතුරු සපයන්නෙ කියලා. මේ මරණය කියන එකත් එබඳු දෙයක්.

ඒ නිසා තථාගතයන් වහන්සේ දේශනා කළා, තැති නොගත් මනසින් සැහැල්ලු මනසින් අවසන් හුස්ම හෙළන්නට නම් හැම කෙනෙක්ම ජීවත් වෙලා ඉන්න කාලේ මරණය ගැන සිතා බලන්න ඕනෑ. තමන්ගේ කෙනෙකු මරණයට පත්වූ අවස්ථාවක ඒ අත්දැකීම තුළින් අවබෝධයක් ඇති කර ගන්න ඕනෑ.

දිරූ ගෙවල් අතහැරීම නුවණට හුරුයි

ඒ නිසා මේ කාරණය ගැන නැවත නැවත හිතන්න, නැවත නැවත කල්පනා කරන්න. අපි මරණයට තැති ගන්නේ, මරණයට බියපත් වන්නේ, සියල්ල අපිට අහිමි වෙනවා වැනි හැඟීමක් ඇති නිසයි. අපිට සියල්ල අහිමි වෙනවා නොවෙයි, මේ කය ඉවත දාන සැනින්ම තවත් කයක් අපි ලබනවා. මේ කය ඉවත දාන්නට බැහැ කියලා යමෙක් බැඳී පවතිනවා නම්, එයින් සිද්ධ වෙන්නෙත් යහපතක් නෙමෙයි. ඒ කය ඇසුරු කරගෙන ප්‍රේත ආදී අයහපත් තලයන්හි උපදින්නට එයම හේතුවක් වෙනවා. හරියට